සෞඛ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තිපෝෂ ලිමිටඩ්

ர்றஹஜஹஉ மඉகரஹர்

யதஷඉற ஜபஉபந்கஹஆ றகஷகடப

Ministry of Health

Sri Lanka Thriposha Ltd.

තිපෝෂ
THRIPOSHA
திரிபோஷ



2020

වාර්ෂික වාර්තාව

ஆண்ட றிக்கை

Annual Report

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

වාර්ෂික වාර්තාව - 2020

පෙළගැස්ම **පිටුව**

1. අපගේ දැක්ම සහ මෙහෙවර 01 - 02

2. සභාපතිතුමාගේ පණිවිඩය 03

3. අධ්‍යක්ෂ මණ්ඩලය 04

4. සමාගම කෙටියෙන් හඳුනා ගනිමු 05

5. විගණන හා කළමනාකරන කමිටුව සහ ප්‍රසම්පාදන කමිටු 06

6. ත්‍රිපෝෂ ආයතනයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය 07

7. මානව සම්පත් විශ්ලේෂණය 08

8. සැපයුම්කරුවන් පිළිබඳ විස්තර 09

9. නිෂ්පාදන තොරතුරු හා අපේක්ෂිත ඉලක්කය 10 - 12

10. ත්‍රිපෝෂ බෙදාහැරීමේ ක්‍රියාවලිය සහ තොරතුරු 13 - 14

11. අළෙවි අංශය 15 - 16

12. 2020 වර්ෂය තුළ අත් කරගත් ජයග්‍රහන සහ මුහුනදීමට සිදුවූ අභියෝග 17

13. 2021 වර්ෂයේ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා සහ අවසන් ඉලක්කය 17 - 18

14. ස්තුතිය 19

15.වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 20 - 47

16. විගණකාධිපති වාර්තාව 48 - 52

අපගේ දැක්ම

ශ්‍රී ලාංකේය ප්‍රජාව

මන්දපෝෂණයෙන් තොර, නිරෝගීමත්,

සෞභාග්‍යමත් සහ අභිමානවත්

ජාතියක් බවට පත් කිරීම

අපගේ මෙහෙවර

සියළු පෝෂණගුණ සපිරි ත්‍රිපෝෂ

අතිරේඛ ආහාරය සෞඛ්‍යාරක්ෂිතව

නිපදවා ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත

නොමිලේ ලබාදෙමින් නිරෝගීමත් ජනතාවක්

බිහිකිරීමේ ජාතික මෙහෙවරට දායකවීම සහ

සමස්ථ ශ්‍රී ලාංකේය ප්‍රජාවගේ පෝෂණ

අවශ්‍යතාවය සපුරාලීම සඳහා පෝෂණීය

අතිරේඛ ආහාර වෙළඳපොළට හඳුන්වාදීමත්,

එසේම මෙම සියළුම නිෂ්පාදනයන් සඳහා

ප්‍රධාන අමුද්‍රව්‍ය සැපයුම්කාරක දේශීය

ගොවියා බලගැන්වීමද අරමුණුවේ

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
සභාපතිතුමාගේ පණිවිඩය



සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ පුර්ණ රජය සතු සමාගමක් ලෙස 2011 වර්ෂයේදි ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සංස්ථාගත කිරීමේදි සංස්ථාවලියේ දක්වා ඇති අරමුණුවලින් ප්‍රධානතම අරමුණ පෝෂණයෙන් සපිරි නිරෝගිමත් ජනතාවක් බිහි කිරීමේ ජාතික මෙහෙවර ඉටු කිරීම උදෙසා ත්‍රිපෝෂ අතිරේක ආහාරය නිෂ්පාදනය කොට සෞඛ්‍ය සායන මගින් ශ්‍රී ලංකාවේ වෙසෙන සියළුම ගර්භනී මව්වරුන්, කිරිදෙන මව්වරුන් හා වයස අවුරුදු 05ට අඩු, බර අඩු දරුවන් උදෙසා නොමිලේ බෙදා හැරීම සිදු වූ අතර 2020 වසරේ මා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ වැඩ භාරගත් දින සිට මේ දක්වාද එම ඉලක්කය සැපිරීමට හැකි විය.

ශ්‍රී ලංකාව ඇතුළු මුළු ලෝකයම වෙලාගත් කොරෝනා වසංගත තත්වය හමුවේ වුවද ඉතා සීමිත සම්පත් ප්‍රමානයක් පමනක් භාවිතා කරමින් 2020 වර්ෂයේදි ත්‍රිපෝෂ මාස්ටර් බෑග් 264,438 ත්‍රිපෝෂ ප්‍රතිලාභීන් 837,021 ක් අතර බෙදාහැරීමට හැකි වූ අතර එමෙන්ම සුපෝෂ අලෙවියෙන් රු මිලියන 481ක ආදායමක් ඉපයීමට හැකි විය

මෙම වර්ෂයේදි ත්‍රිපෝෂ පිට භාවිතයෙන් පෝෂ්‍යදායී බිස්කට් වර්ගයක් නිපදවීම සඳහා අවශ්‍ය යන්ත්‍ර පද්ධතියක් රු මිලියන 185 ක් වැයකර මිලදිගෙන ස්ථාපිත කිරීමට හැකිවිය. එමෙන්ම රු මිලියන 18 ක් වැයකර වායුසම්කරන පද්ධතියක් මිලදි ගෙන ස්ථාපිත කරන ලදි

මේ සඳහා අපහට සහයෝගය දැක්වූ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, සෞඛ්‍ය පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමිය සහ ලේකම් මේජර් ජනරාල් සංජීව මුණසිංහ මැතිතුමා, 2020 වර්ෂයේ මැද භාගයේදි ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපණ, යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතට පත්වීමෙන් පසු එම අමාත්‍යාංශයේ අමාත්‍ය ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා, ලේකම් ගරු කේ. එම්. එස්. ඩී. ජයසේකර මැතිතුමිය, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු එස්. ආර්. ආටිගල මැතිතුමා, අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමස්ත සේවක මණ්ඩලය හා අඛණ්ඩ නිෂ්පාදනයක් උදෙසා නිසිකලට අමුද්‍රව්‍ය සපයන අපගේ සැපයුම්කරුවන් හා අපහට නන් අයුරින් සහය දක්වන සියළු දෙනා ඉතා කෘතඥ පුර්වකව සිහිපත් කරමි.

දිප්ති කුලරත්න
සභාපති
ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
අධ්‍යක්ෂ මණ්ඩලය - 2020

- සභාපති, දිප්ති කුලරත්න මහතා

- අධ්‍යක්ෂ, වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා
  සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂිකා, වෛද්‍ය චිත්‍රමාලි ද සිල්වා මහත්මිය
  මාතෘ හා ළමා කාර්‍යාංශය
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- අධ්‍යක්ෂ, නිතිඥ ප්‍රනිත් මාහල්ල මහතා
  නීති උපදේශක

- අධ්‍යක්ෂිකා, තේජා හේරත් මහත්මිය
  ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරිණී
  කාර්මික තාක්ෂණ ආයතනය

- අධ්‍යක්ෂිකා, ලක්මිනි එන් මාගොඩරත්න මහත්මිය.
  පෝශණ සම්බන්ධීකරණ අංශය.
  සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

- තනූජා ප්‍රියදර්ශනි අල්විස් මහත්මිය
  අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ත්‍රිපෝෂ ආයතනය කෙටියෙන් හඳුනා ගනිමු

- ලිපිනය - තැ.පෙ. 17, කොළඹ පාර, කපුවත්ත, ජා-ඇල
- දුරකථන - 0112 - 236588
0112 - 237418
0112 - 233451
- ෆැක්ස් අංකය - 0112 - 237363
- ඊ-මේල් ලිපිනය - thriposha@gmail.com
- අමාත්‍යාංශය - කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
- ආයතනයේ ස්වභාවය - 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ පූර්ණ රාජ්‍ය සමාගමකි
- සමාගම් ලියාපදිංචි අංකය - PB /3873
- ප්‍රධාන නිෂ්පාදනය - සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නොමිලේ ලබාදෙන පෝෂණ ගුණයෙන් හා සෞඛ්‍යයෙන් පිරිපුන් ත්‍රිපෝෂ අතිරේක ආහාරය සහ අලෙවිය සඳහා සුපෝෂ
- ත්‍රිපෝෂ බෙදා හැරීමේ මධ්‍යස්ථාන - * දිවයින පුරා ඇති සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථාන
* පරිවාස හා ළමා රක්ෂණ මධ්‍යස්ථාන
- සුපෝෂ බෙදාහැරීම - දිවයින පුරා විසිරි සිටින අලෙවි නියෝජිතයින් 46 දෙනෙක් මගින් සුපෝෂ බෙදාහැරීම සිදුකරනු ලැබේ
- බෙදා හරිනු ලබන ආකාරය - දුම්රිය වැගන් හා ලොරි රථ මගින්
- ප්‍රතිලාභීන් - * සියලුම ගර්භනී හා කිරිදෙන මව්වරුන්
* මව්වරුන්
* පෝෂණ අවශ්‍යතා සහිත ළමුන්
* ඇතැම් රෝගීන්
- මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව - අට ලක්ෂ තිස්හත් දහස ඉක්මවා ඇත
- බැංකුව - ලංකා බැංකුව
- විගණක - විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
විගණන හා කළමනාකරණ කමිටුව - 2020

- R. M. P.S. අබේරත්න මයා
  සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- වෛද්‍ය චිත්‍රමාලි ද සිල්වා මිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ආචාර්ය තේජා හේරත් මිය
  සාමාජික - විගණන හා කළමනාකරණ කමිටුව
  අධ්‍යක්ෂිකා - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එන්.එන්.කේ. දිවාකර මිය
  නිරීක්ෂක - විගණන හා කළමනාකරණ කමිටුව
  විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය

- තනුජා ප්‍රියදර්ශනී අල්විස් මිය
  ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ඩී. බී. තරිඳු වාමික මයා
  මූල්‍ය කළමණාකරු - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- එල්. ජේ. එස්. ප්‍රේමචන්ද්‍ර මයා
  කැදවුම්කරු - විගණන හා කළමනාකරණ කමිටුව
  අභ්‍යන්තර විගණක - ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව
(රුපියල් මිලියන 200 දක්වා)

- දිප්ති කුලරත්න මයා
  සභාපති
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- කේ. පී. යෝගවන්ද්‍ර මයා
  ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන)
  සෞඛ්‍ය අමාත්‍යාංශය

- සී. බී. එස්. අයි. පෙරේරා මිය
  ගණකාධිකාරී (වැය ii)
  සෞඛ්‍ය අමාත්‍යාංශය

සුළු ප්‍රසම්පාදන කමිටුව
(රුපියල් මිලියන 25 දක්වා)

- චම්පික සල්ගාදු මයා
  ජ්‍යෙෂ්ඨ කළමණාකරු (මෙහෙයුම්)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- තනුජා ප්‍රියදර්ශනී අල්විස් මිය
  ජ්‍යෙෂ්ඨ කළමණාකරු (මානව සම්පත් හා නීති)
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

- ඩී. බී. තරිඳු වාමික මයා
  මූල්‍ය කළමණාකර
  ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ ඉතිහාසය හා

වර්තමාන තත්වය

ඉතිහාසය

1973 වර්ෂයේදී සෞඛ්‍ය අමාත්‍යාංශය සහ කෙයා සංවිධානය සමග ඇති කරගත් ගිවිසුමක් මත ඇමෙරිකාවෙන් ත්‍රිපෝෂ ආනයනය කර ශ්‍රී ලංකාව තුලදී පැකට් කර ඉලක්කගත ප්‍රතිලාභීන් අතට පත් කරන ලදි.

1979 වර්ෂයේදී ටෙන්ඩර් කැඳවීමෙන් ලංකා දුම්කොළ සමාගමට ත්‍රිපෝෂ වැඩසටහනේ කළමණාකාරිත්වය පවරන ලද අතර 1987 වර්ෂයේදී කෙයා ආයතනය සම්පූරණයෙන්ම මෙම වැඩසටහනෙන් ඉවත් වන ලදි. 1987 සිට 2010/09/17 දින දක්වා ලංකා දුම්කොළ සමාගම විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ කළමනාකාරිත්වය පවත්වාගෙන යන ලදි.

රටේ මන්දපෝෂණය තුරන් කරලිමේ ජාතික වැඩසටහන වඩාත් සවිබල ගැන්වීමේ අරමුණින් ත්‍රිපෝෂ වැඩසටහන කැබිනට් මණ්ඩල තීරනයක් මගින් 2010/09/17 වන දින 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් නමින් පූර්ණ රජය සතු සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 07 දෙනෙකුගෙන් සමන්විතව සංස්ථාපනය කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම පූර්ණ වශයෙන් කළමනාකාරිත්වය භාරගෙන කටයුතු කිරීම 2011/01/01 දින සිට ආරම්භ විය.

වර්තමාන තත්වය

2020 වර්ෂයේ 2020.08.09 දිනැති අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතට පවරාගන්නා ලදි.

ප්‍රවර්තන වර්ෂයේ සම්පූර්ණ ත්‍රිපෝෂ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 837,021 ක් වන අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 22.30%ක අඩුවීමකි. එමෙන්ම 2020 වර්ෂයේ සමස්ථ නිෂ්පාදනය මෙ. ටොන් 15,429 සිට 7,927 දක්වා අඩුවිය. මෙම තත්වය ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූවේ ශ්‍රී ලංකාව ඇතුළු සමස්ථ ලෝකයටම බලපාන ලද කොරෝනා වසංගත තත්වය සහ නිසි පරිදි අමුද්‍රව්‍ය මිලදී ගැනීමට නොහැකිවීමයි

2020 වර්ෂයේ සමස්ථ ආදායම රු මිලියන 3,321 සිට රු මිලියන 2,034ක් දක්වා අඩුවී ඇති අතර ඒ අනුව බදු පෙර ලාභය රු මිලියන 178 සිට රු මිලියන 100 දක්වා අඩුවී ඇත. මෙම තත්වය ඇතිවීමටද ඉහත සඳහන් කරන කරුණු ඉවහල් විය කෙසේ වුවද මෙම වර්ෂයේ සුපෝෂ නිෂ්පාදිත පිරිවැය ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙවන ලද මුදල රු මිලියන 349 කි

මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවා ගණන, තනතුරු හා අනුමත සේවක සංඛ්‍යාව

01	**ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්**		
	• ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)	01	
	• ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති)	01	02
02	**මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්**		
	• කළමනාකරු (ඉංජිනේරු හා නිෂ්පාදන සේවා)	01	
	• කළමනාකරු (තත්ත්ව පාලන)	02	
	• කළමනාකරු (මුදල්)	01	
	• කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන)	01	05
03	**කනිෂ්ඨ කළමනාකරුවන්**		
	• බෙදාහැරීමේ නිළධාරි	01	
	• අභ්‍යන්තර විගණක නිළධාරි	01	
	• මුදල් නිළධාරි	01	
	• සැපයීම් නිළධාරි	01	
	• ගබඩා නිළධාරි	01	
	• ගුදම් ගබඩා නිළධාරි	01	
	• නිෂ්පාදන නිළධාරි	03	
	• පරිපාලන නිළධාරි	01	
	• ගිණුම් නිළධාරි	01	
	• ඉංජිනේරු සේවා නිළධාරි	01	12
04	**කළමනාකරණ සහකාර (තාක්ෂණ)**		04
05	**කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)**		18
06	**ප්‍රාථමික සේවා**		
	ප්‍රාථමික සේවා (ශිල්පීය)		
	• ටියදුරු	07	
	• විදුලි කාර්මික	04	11
	ප්‍රාථමික සේවා (අර්ධ ශිල්පීය)		
	• බොයිලේරුකරුවන්	03	
	• පිටර්වරුන්	03	
	• ලේත් යන්ත්‍රකරුවන්	02	
	• යන්ත්‍ර ක්‍රියාකරු	28	
	• තත්ත්ව පරීක්ෂක	07	
	• ගිනි නිවීමේ උපස්ථායක	01	
	• ෆෝක්ලිෆ්ට් යන්ත්‍ර ක්‍රියාකරු	02	46
	ප්‍රාථමික සේවා (ශිල්පීය නොවන)		
	• උද්‍යානකරු	02	
	• කම්කරු/කාර්යාල සහායක	02	
	• සාමාන්‍ය කම්කරු	129	
	• කම්කරු පාලිකා	01	134
	එකතුව		232

2020 වර්ෂයේ සැපයුම්කරුවන් පිළිබඳ විස්තර

- **සෝයා බෝංචි**

එස්. ඩී. කේ. යුනයිටඩ් ඇග්‍රිවෙන්චස් (පුද්ගලික)
සමාගම නො. 1280/5,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

- **බඩඉරිඟු**

එස්. ඩී. කේ. යුනයිටඩ් ඇග්‍රිවෙන්චස් (පුද්ගලික)
සමාගම නො. 1280/5,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

කේ. එස්. ටී. එවර්ග්‍රීන් (පුද්ගලික) සමාගම
නො. 71,
මිගමුව පාර,
කඳාන.

- **කිරි පිටි**

මිල්කෝ (පුද්ගලික) සමාගම
නො: 45,
නාවලපාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

- **ක්‍රාෆ්ට් පෙපර් බෑග්**

අබිදුල්ලා ඉන්ඩ්‍රස්ට්ක්ස් පැකේජින්
(පුද්ගලික) සමාගම
නො: 72, මහ විද්‍යාල මාවත
කොළඹ 13

- **රැලි සහිත පෙට්ටි** (Corrugated Boxes)

එක්ස්පැක් කොරුගේටඩ් කාටන්ස් ප්‍රයිවට් ලිමිටඩ්
නො.79, පටටවිල පාර,
ගොනවල,
කැළණිය

- **පොලිතින්**

සෙල්මො (පුද්ගලික) සමාගම
නො.59/1,
නාරම්පොල පාර,
මොරගල,
දෙකටන.

ටෆ්ලයින් ලිමිටඩ්
නො.188,
හයිලෙවල් පාර,
මිගොඩ

- **විටමින්**

ජේ. කේ. ට්‍රේඩිලින්ක් (පුද්ගලික) සමාගම
නො: 44,
තලවතුගොඩ පාර,
පිටකෝට්ටේ.

ඩී. පී. ඔ. ලංකා (පුද්ගලික) සමාගම
නො. 235/2,
හේකිත්ත පාර,
වත්තල.

- **මිනරල්**

විකුමරත්න (පුද්ගලික) සමාගම
නො. 231, ඩෑම් විදිය
කොළඹ - 12

2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා නිෂ්පාදනය (මාස්ටර් බෑග්)

මාසය	2016	2017	2018	2019	2020
ජනවාරි	57,542	56,236	51,069	43,003	46,805
පෙබරවාරි	53,416	48,288	40,351	35,715	30,492
මාර්තු	55,410	58,150	47,969	47,125	30,118
අප්‍රේල්	44,501	46,956	25,720	28,954	30,583
මැයි	52,757	49,432	55,122	38,109	30,745
ජූනි	15,757	40,134	50,268	43,372	21,959
ජූලි	-	48,128	49,042	38,534	16,995
අගෝස්තු	3,060	53,179	40,374	52,835	4,850
සැප්තැම්බර්	38,071	36,295	48,670	47,082	13,147
ඔක්තෝම්බර්	38,806	27,311	50,036	71,004	11,877
නොවැම්බර්	47,392	49,829	47,152	57,490	16,645
දෙසැම්බර්	28,898	30,017	23,703	17,329	11,910
මාස්ටර් බෑග්	**435,610**	**543,955**	**529,476**	**520,552**	**266,126**
මෙ. ටොන්	**9,801**	**12,239**	**11,913**	**11,712**	**5,988**

2016 සිට 2020 වසර දක්වා නිෂ්පාදනය ප්‍රස්ථාරයක් මගින් (මාස්ටර් බෑග්)



2017 අප්‍රේල් මස සිට 2020 වර්ෂය දක්වා සුපෝෂ නිෂ්පාදනය (මෙ.ටොන්)

වර්ෂය	ප්‍රමාණය (මෙ.ටොන්)
2017	1,207
2018	2,607
2019	3,717
2020	1,939
එකතුව	**9,470**

2017 අප්‍රේල් මස සිට 2020 වර්ෂය දක්වා සුපෝෂ නිෂ්පාදනය ප්‍රස්ථාරයක් මගින් (මෙ.ටොන්)



2021 අපේක්ෂිත ඉලක්කය

- නොමිලේ ලබා දෙනු ලබන ත්‍රිපෝෂ සියලුම ප්‍රතිලාභීන්ට ලබාදීමේ 100% ඉලක්කය ජයගැනීම.
- දේශීය ගොවියා තව තවත් සුරක්ෂිත කිරීමේ අරමුණ පෙරදැරිව ඔවුන්ගේ නිෂ්පාදන ගොවි සංවිධාන වෙතින් ත්‍රිපෝෂ ආයතනයට සපයා ගැනීම
- අප සතු සුපෝෂ අළෙවි නියෝජිත ජාලය තවදුරටත් පුළුල් කිරීම.
- නිෂ්පාදන කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාමට අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය කැබිනට් මණ්ඩල තීරණ මගින් මිලදි ගැනීම මගින් අමුද්‍රව්‍ය හිගයට විසඳුම් ලබාදීම
- බඩ ඉරිගු සහ සෝයා ගොවි සමාගම් හා සංවිධාන වෙතින් සෘජුවම මිලදිගෙන ගබඩා කිරීමට අවශ්‍ය සයිලෝ පද්ධතියක් ස්ථාපිත කිරීම හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය
- ත්‍රිපෝෂ පිට භාවිතයෙන් නිපදවීමට බලාපොරොත්තු වන බිස්කට් වර්ගය නිෂ්පාදනය කිරීමට මිලදි ගන්නා යන්ත්‍ර පද්ධතියි ස්ථාපිත කිරීමට ඉදිකරන ලද ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සහ එම යන්ත්‍ර පද්ධතිය මිලදි ගෙන ස්ථාපිත කිරීම

2021 වර්ෂයේ ත්‍රිපෝෂ නිෂ්පාදනය පහත අයුරින් ඉහළ නැංවීම ආයතනයේ ඒකායන අපේක්ෂාවයි.

මාසය	ප්‍රමාණය (මෙ. ටොන්)
ජනවාරි	2,157
පෙබරවාරි	2,133
මාර්තු	2,510
අප්‍රේල්	2,051
මැයි	2,322
ජුනි	2,416
ජුලි	2,616
අගෝස්තු	2,499
සැප්තැම්බර්	2,322
ඔක්තෝබර්	2,416
නොවැම්බර්	2,616
දෙසැම්බර්	2,239
එකතුව	**28,297**

ත්‍රිපෝෂ බෙදා හැරීමේ ක්‍රියාවලිය

ත්‍රිපෝෂ කර්මාන්ත ශාලාව (ජා-ඇල)



බෙදාහැරීමේ කටයුතු කිරීම (ලොරි රථ මගින් හා දුම්රිය වැගන් මගින්)







ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

සෞඛ්‍ය මධ්‍යස්ථාන (ඖෂධ)

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය

ළමා මධ්‍යස්ථාන











2020 වර්ෂයේ ත්‍රිපෝෂ බෙදා හැරීමේ තොරතුරු

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශ	ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2020	2020 වර්ෂයේ බෙදාහරින ලද ත්‍රිපෝෂ මාස්ටර් බෑග් ප්‍රමාණය
අම්පාර	14,658	4,870
අනුරාධපුරය	43,703	10,620
බදුල්ල	36,072	10,971
මඩකලපුව	23,876	6,791
කොළඹ	60,003	22,467
ගාල්ල	34,713	10,176
ගම්පහ	67,540	16,379
හම්බන්තොට	28,923	11,276
යාපනය	18,372	4,484
කල්මුණේ	35,723	9,120
කළුතර	30,789	14,252
මහනුවර	59,303	13,035
කෑගල්ල	30,047	9,027
කිලිනොච්චිය	4,955	2,175
කුරුණෑගල	64,936	14,356
මන්නාරම	4,568	3,258
මාතලේ	20,533	5,893
මාතර	41,782	11,945
මොණරාගල	26,490	6,058
මුලතිව්	4,636	2,016
නුවරඑළිය	33,383	15,677
පොළොන්නරුව	20,962	13,925
පුත්තලම	27,081	13,494
රත්නපුර	49,588	19,751
ත්‍රිකුණාමලය	18,942	6,429
වව්නියාව	7,184	3,308
ළය රෝහල	4,410	1,673
පරිවාස හා ළමාරක්ෂණ අධිකාරි	23,849	1,012
එකතුව	**837,021**	**264,438**

අලෙවි අංශය

01. අලෙවි අංශයේ ආරම්භය

“රාජ්‍ය ප්‍රතිපත්තින්ට අනුකූල වන වෙනත් අනුමත පෝෂ්‍ය පදාර්ථයන් නිපදවීම සහ අලෙවිකරණය“ ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම පිහිටුවීමේ තවත් එක් පරමාර්ථයකි. මෙම පරමාර්ථය යථාර්තයක් කරමින් 2016 වර්ෂයේ දී නව යන්ත්‍ර සූත්‍ර ස්ථාපිත කිරීම නිසා නිපදවන ලද අතිරික්ත ත්‍රිපෝෂ නිෂ්පාදනය “සුපෝෂ“ නමින් වෙළඳපොලට හඳුන්වාදීමට 2017 වර්ෂයේදී සිදු කරන ලදී.

02. අලෙවි අංශය ආරම්භ කිරීමේ අරමුන

රාජ්‍ය ආයතන යනු අලාභ ලබන ආයතනය යන මිත්‍යා මතයට අභියෝග කරමින් රජයට බරක් නොවන රජය මත යැපෙන ආයතනයක් නොවි ස්වාධිනව උපයාගත් ආදායම මත යැපෙන ලාභ ලබන රාජ්‍ය ආයතනයක් විම.

03. අලෙවි අංශයේ විකාශනය

මෙම සුපෝෂ නිෂ්පාදනය ග්‍රෑම් 100, ග්‍රෑම් 250, ග්‍රෑම් 500 සහ ග්‍රෑම් 750 යන බාණ්ඩ 04 යටතේ අලෙවි නියෝජිතයින් 06 දෙනෙකු මගින් මහනුවර, කළුතර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මුලින්ම වෙළඳපොළට හඳුන්වාදෙන ලදි. 2020 වර්ෂය අවසන් වන විට 46 දෙනෙකුගෙන් සමන්විත අලෙවි නියෝජිත ජාලයක් මගින් දිවයිනේ දිස්ත්‍රික්ක 11ක් ආවරණය කිරීමට හැකි වී ඇත. මීට අමතරව ත්‍රිපෝෂ සමාගම් පරිශ්‍රය තුල සුපෝෂ සහ හයිලන්ඩ් නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි කුටියක්ද විවෘත කරන ලදි.

2020 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වියදම් ප්‍රතිපූරණය කරගැනීම සහ සුපෝෂ ඇතුළු අනෙකුත් නිෂ්පාදන අලෙවියෙන් උපයාගන්නා ලද ආදායම රු මිලියන 1,978ක් වන අතර බදු පෙර ශුද්ධ ලාභය රු මිලියන 101කි.

2020 වර්ෂයේ සුපෝෂ අලෙවි ආදායම

මාසය	වටිනාකම (රු දහස්)
ජනවාරි	58,431
පෙබරවාරි	59,430
මාර්තු	67,531
අප්‍රේල්	254
මැයි	20,784
ජුනි	27,998
ජුලි	124,885
අගෝස්තු	90,761
සැප්තැම්බර්	10,052
ඔක්තෝබර්	8,377
නොවැම්බර්	12,500
දෙසැම්බර්	-
මුළු අලෙවි ආදායම	**481,003**



2020 වර්ෂය තුළ අත්කරගත් ජයග්‍රහණ සහ මුහුන දිමට සිදුවූ අභියෝග

2020 වසරේ අප ලද ජයග්‍රහන

01. ත්‍රිපෝෂ පිට භාවිතයෙන් පෝෂ්‍යදායී බිස්කට් වර්ගයක් නිපදවීම සඳහා අවශ්‍ය යන්ත්‍ර පද්ධතියක් රු මිලියන 185 ක් වැයකර ජපානයේ Soken Tech Co. Ltd සමාගමෙන් මිලදි ගෙන ස්ථාපිත කිරීම

02. රු මිලියන 18 ක් වැයකර වායුසම්කරන පද්ධතියක් මිලදි ගෙන ස්ථාපිත කිරීම

2020 වසරේ මුහුන දිමට සිදුවූ අභියෝග

01 ශ්‍රී ලංකාව ඇතුළු මුළු ලෝකයම වෙලාගත් කොරෝනා වසංගතය හේතුවෙන් නිෂ්පාදන කටයුතු අඛන්ඩව සිදුකරගෙන යාමට නොහැකි වීම

02 සීමාකාරී සාධක (ප්‍රධාන අමුද්‍රව්‍ය) හේතුවෙන් ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදීමට නොහැකි වීම

2021 වර්ෂයේ සාර්ථකත්වය වෙනුවෙන් යෝජනා

01. පාරිභෝගික අවශ්‍යතාවය 100% සම්පූර්ණ කිරීමට නිෂ්පාදනය සඳහා අවශ්‍යය අමුද්‍රව්‍ය අඛන්ඩව මිලදි ගැනීම.

02. අමුද්‍රව්‍ය හිග කාලවලදීද නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය අමුද්‍රව්‍ය ගබඩා කර තබාගැනීම අවශ්‍ය ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම. මේ සඳහා මෙ.ටොන් 4000 ප්‍රමානයේ සයිලෝ එකක් ඉදිකිරීම.

03. අමුද්‍රව්‍ය මිල ඉහලයාම හේතුවෙන් ත්‍රිපෝෂ සමාගම සඳහා වාර්ෂික අයවැයෙන් වෙන්කරනු ලබන ප්‍රතිපාදන වැඩි කිරීම.

04. අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් මගින් සුපෝෂ නව නිෂ්පාදිතය (Suposha Serial Bar) පාරිභෝගිකයින් අතර වඩාත් ප්‍රචලිත කිරීම හා වෙළඳ පොළට හදුන්වාදීම.

05. අවසන් නිෂ්පාදනය නියමිත ප්‍රතිලාභියාට ලබාදීම සඳහා බෙදාහැරීමේ කටයුතු විදිමත් හා කාර්‍යක්ෂම කිරීම

අවසන් ඉලක්කය

රජයට බරක් නොවන රජය මත යැපෙන ආයතනයක් නොවී, ස්වාධීනව උපයාගත් ආදායම මත යැපෙන රාජ්‍ය ආයතනයක් වීම අපගේ අවසන් ඉලක්කය වේ

ස්තුතිය...!!!

අප දිරිමත් කරමින් නිරතුරු අපට මාර්ගෝපදේශකත්වය ලබා දුන් සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමිය, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපණ, යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා, අප නිසි මගට යොමු කරමින් උපදෙස් ලබා දුන් එම අමාත්‍යාංශ වල ලේකම්වරු වන ගරු මේජර් ජනරාල් සංජීව මුණසිංහ මැතිතුමා, ගරු කේ. එම්. එස්. ඩී. ජයසේකර මැතිතුමියට සහ අපට වාර්ෂිකව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් අතහිත දුන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ ලේකම් ගරු එස්. ආර්. ආටිගල මැතිතුමාට අපගේ ස්තූතිය පුදකර සිටිමු.

එලෙසින්ම ආයතනයේ කළමනාකාරිත්වය දරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම මහත්ම, මහත්මීන්ගෙන් ලද සහාය අප සැමට ආශිර්වාදයක්ම විය. එමෙන්ම අපගේ සැපයුම්කරුවන් හා බාහිරව අපට සේවය සලසන සැම කෘතඥ පූර්වකව සිහිපත් කරමු.

අපගේ ආයතනයේ ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් ගලා යන ධුරාවලින් තෘප්තිමත්ව සේවය කරන කාර්ය මණ්ඩලයක් දක්නට ලැබීම ඉමහත් සතුටකි. ආයතනයේ දියුණුවට ඔවුන් ලබා දෙන දායකත්වය අගය කළ යුතුය. අවසන් වශයෙන් මෙම ඉලක්ක ජය ගැනීමට නිරතුරු වෙහෙසෙන ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සමස්ත කාර්ය මණ්ඩලයට ජයග්‍රහණයේ ප්‍රණාමය පුදකර සිටිමු.



ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	31/12/2020 රු. ශත	31/12/2019 රු.
ආදායම			
අයභාරය	02	1,995,602,711.77	3,271,379,657
අඩු කළා:- භාවිතයට සුදානම් නිෂ්පාදනවල පිරිවැය	03	(1,467,445,466.99)	(2,470,824,588)
විකුණුම් පිරිවැය	04	(357,336,047.81)	(546,683,677)
		170,821,196.97	**253,871,392**
වෙනත් ආදායම්	05	39,124,770.87	50,441,659
අඩු කළා : වියදම්			
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	06	10,131,866.72	22,243,385
පරිපාලන වියදම්	07	92,126,861.21	102,800,347
මූල්‍ය සහ වෙනත් වියදම්	08	6,961,463.54	1,134,223
		109,220,191.47	**126,177,955**
වර්ෂය සඳහා වියදම ඉක්මවූ බදු පෙර ආදායම		**100,725,776.37**	**178,135,097**
වර්ෂය සඳහා ආදායම් බද්ද - 2020	09	(13,497,065.35)	-
වර්ෂය සඳහා වියදම ඉක්මවූ බදු පසු ආදායම		**87,228,711.02**	**178,135,097**

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉතා වැදගත් කොටසක් වන පිටු අංක 6 සිට 27 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශ සඳහා සිදු කරන ලද සටහන් හා එක්ව ඉහත සඳහන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය කියවනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	31/12/2020 රු. ශත	31/12/2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ	13	1,151,901,939.80	671,709,769
විලම්බිත බදු වත්කම්		333,079.41	-
ජංගම වත්කම්			
වට්ටෝරු භාණ්ඩ	14	205,757,637.03	178,860,757
වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත	15	138,384,633.00	186,986,742
මුදල් හා මුදල් සමාන දෑ	16	448,334,872.86	487,882,035
		792,477,142.89	**853,729,534**
මුළු වත්කම්		**1,944,712,162.10**	**1,525,439,303**
කොටස් හිමිකම් හා බැරකම්			
ප්‍රාග්ධනය හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	17	304,600,000.00	304,600,000
විලම්බිත වගකීම්	18	199,356,451.03	250,562,776
ප්‍රත්‍යාගණන සංචිත	19	462,899,383.36	131,176,703
වියදම ඉක්මවූ සමුච්චිත ආදායම		731,769,717.34	600,524,515
මුළු කොටස් හිමිකම්		**1,698,625,551.73**	**1,286,863,993**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	20	75,103,012.25	53,309,804
වෛද්‍යාධාර අරමුදල	21	318,622.82	246,837
කාල නිර්ණ ණයවර	22	23,437,500.00	-
		98,859,135.07	**53,556,640**
ජංගම බැරකම්			
වෙළඳ සහ වෙනත් ගෙවීම් නියමිත	23	147,227,475.30	185,018,670
මුළු කොටස් හිමිකම් හා බැරකම්		**1,944,712,162.10**	**1,525,439,303**
		-	-

ඉහත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉතා වැදගත් අංගයක් සුසාදනය කරන පිටු අංක 6 සිට 27 දක්වා ගෙන හැර ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශවලට කරන ලද සටහන් හා සමග සංයෝජිතව කියවිය යුතු වන්නේ ය.

2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත.

.....
මූල්‍ය ප්‍රධානි

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සහ ඒ උදෙසා අනුමත කර අත්සන් කරන ලදී.

....
සභාපති **අධ්‍යක්ෂ**

ජා ඇල, කපුවත්ත.
දිනය : 02/03/2021

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
කොටස් හිමිකම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	ප්‍රකාශිත ප්‍රාග්ධනය		ප්‍රාග්ධන සංචිත		ප්‍රත්‍යාගණන සංචිත		වියදම ඉක්මවූ සමුච්චිත ආදායම		එකතුව	
		රු.	ශත	රු.	ශත	රු.	ශත	රු.	ශත	රු.	ශත
2019.01.01 දිනට ශේෂය				390,085,608		306,378,658		422,306,485		1,118,770,750	
ගැළපුම්		304,600,000		(129,574,368)		(175,025,632)		-		-	
එකතු කිරීම් / අඩු කිරීම් - 2019		-		49,916,075		(176,322)				49,739,753	
සොබ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම් අදාළ ක්ෂය වීම්				(59,864,539)		-		-		(59,864,539)	
පූර්ව වර්ෂයේ ගැළපුම්		-		-		-		82,933		82,933	
2019 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම				-		-		178,135,097		178,135,097	
2019.12.31 දිනට ශේෂය		**304,600,000**		**250,562,776**		**131,176,703**		**600,524,515**		**1,286,863,993**	
2020.01.01 දිනට ශේෂය		304,600,000.00		250,562,775.52		131,176,703.11		600,524,514.63		1,286,863,993.26	
එකතු කිරීම් / අඩු කිරීම් - 2020		-		5,775,732.85		331,722,680.25		-		337,498,413.10	
සොබ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වත්කම් අදාළ ක්ෂය වීම්	18	-		(56,982,057.32)		-		-		(56,982,057.32)	
පූර්ව වර්ෂයේ ගැළපුම්	24	-		-		-		44,016,491.69		44,016,491.69	
2020 වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම බදු පසු		-		-		-		87,228,711.02		87,228,711.02	
2020.12.31 දිනට ශේෂය		**304,600,000.00**		**199,356,451.05**		**462,899,383.36**		**731,769,717.34**		**1,698,625,551.75**	

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	31/12/2020 රු.	31/12/2019 රු.
මෙහෙයුම් කටයුතු වල මුදල් ප්‍රවාහ		
වියදම ඉක්මවූ බදු පෙර ආදායම	100,725,776	178,135,097
ගැළපුම්		
ක්ෂය වීම්	61,575,852	61,971,983
රඳවා ගැනීමේ බදු	-	277,251
පොලි ආදායම	(22,575,619)	(14,433,406)
වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන	26,568,298	14,827,855
වෛද්‍යාධාර දායකත්වය සඳහා ප්‍රතිපාදන	221,760	208,740
පූර්ව වර්ෂයේ ගැළපුම්	44,016,492	(1,420,800)
	109,806,783	**61,431,623**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	**210,532,559**	**239,566,719**
කාරක ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්කම්		
වෙළඳ හා වෙනත් ලැබීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම)	48,602,109	25,793,626
වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිතවල වැඩිවීම / (අඩුවීම)	(107,871,339)	(4,720,786)
වට්ටෝරු භාණ්ඩ වැඩිවීම / (අඩුවීම)	(26,896,880)	(51,726,030)
	(86,166,110)	**(30,653,190)**
මෙහෙයුම් කටයුතු වලින් උත්පාදිත මුදල්	**124,366,449**	**208,913,530**
අඩු කළා : ගෙවන ලද පාරිතෝෂික	(4,775,090)	(6,416,584)
වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම්	(149,974)	(171,350)
මෙහෙයුම් කටයුතු වල ශුද්ධ මුදල් ප්‍රවාහ	**119,441,386**	**202,325,596**
ආයෝජන කටයුතු වල මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ අත්කර ගැනීම	(210,045,343)	(77,758,585)
කෙටි කාලීන ආයෝජනයන්හි කළ ආයෝජන	(163,022)	(125,000,000)
කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ	-	22,513,629
කාල නිර්ණ ණයවර	79,687,500	-
ලද පොලි	5,384,276	7,642,613
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	**(125,136,588)**	**(172,602,343)**
මූල්‍ය කටයුතු වල මුදල් ප්‍රවාහ		
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	(51,206,324)	(10,124,787)
මුදල් සහ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම	(56,901,527)	19,598,466
මුදල් හා මුදල් හා සමාන දෑ ඉදිරියට ගෙන එන ලදී	202,940,940	183,342,473
මුදල් හා මුදල් හා සමාන දෑ ඉදිරියට ගෙන යන ලදී	**146,039,413**	**202,940,940**
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති මුදල් සහ මුදල් හා සමාන දෑ හි විශ්ලේෂණය		
ලංකා බැංකුව, ජා-ඇල - ගිණුම් අංකය 71324617	101,983,383	16,524,816
ලංකා බැංකුව, ජා-ඇල - ගිණුම් අංකය 80306903	44,056,030	186,416,124
	146,039,413	**202,940,940**

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

නිෂ්පාදන ගිණුම
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන	31/12/2020 රු. ශත	31/12/2019 රු.
නිෂ්පාදන පිරිවැය			
අමු ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය			
2020.01.01 දිනට ශේෂය		117,286,466.32	88,411,099
මිලදි ගැනිමි	10	1,126,423,718.99	2,065,207,868
		1,243,710,185.31	2,153,618,967
වටිටෝරු භාණ්ඩ හානිය		-	(291,032)
2020.12.31 දිනට ශේෂය	14	(143,338,764.90)	(117,286,466)
පරිභෝජනය කළ අමුද්‍රව්‍යවල පිරිවැය		**1,100,371,420.41**	**2,036,041,469**
සෘජු ශ්‍රම හා කළමනාකරණ පිරිවැය	11	225,256,008.84	213,981,333
කම්හල් පොදුකාර්ය වියදම්	12	140,813,278.97	205,377,939
මූලික පිරිවැය		**1,466,440,708.22**	**2,455,400,741**
කෙරෙමින් පවත්නා වැඩ			
2020.01.01 දිනට ශේෂය		2,192,397.76	12,605,573
2020.12.31 දිනට ශේෂය	14	(1,187,638.99)	(2,192,398)
		1,004,758.77	**10,413,175**
මුළු නිෂ්පාදන පිරිවැය		**1,467,445,466.99**	**2,465,813,916**

1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1.1 වාර්තා කිරීමේ ආයතනය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය, පූර්ණ රජය සතු සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර පිහිටුවා ඇති, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීමක් සහිත සමාගමකි.

2020 දී, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය, එහි රේඛීය අමාත්‍යාංශය ලෙස කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ අනුයුක්ත කෙරිණි. (2020.08.09 දිනැති 2187/27 අති විශේෂ ගැසට් පත්‍රය)

සමාගමේ ලියා පදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, ජා ඇල, කපුවත්ත, තැ.පෙ. අංක 17 යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ "ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන" සඳහා "ත්‍රිපෝෂ" නිෂ්පාදනය කරනු ලබන එකම සමාගම වනුයේ මෙම සමාගමයි.

සමාගමේ වෙනත් ප්‍රධාන කාර්යයන් වූයේ :

- ශ්‍රී ලංකාව තුළ මාතෘ සහ ළමා මන්දපෝෂණය අඩු කිරීම සඳහා ශක්ති වර්ධක ශ්‍රී ලාංකික අතිරේක ආහාර නිෂ්පාදිතයක් වන "ත්‍රිපෝෂ" වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය සහ බෙදා හැරීම පිණිස පහසුකම් සැලසීම.
- ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය සපයනු ලබන දේශීය ගොවීන් හැකි තාක් දුරට ආදායම් ජනනය වන මාර්ග සඳහා ධෛර්යමත් කිරීම.
- රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව, වෙනත් ආකාරයේ ශක්තිවර්ධක මිශ්‍ර කරන ලද ආහාර ද්‍රව්‍ය සඳහා පවතින වෙළඳපොළ අවම කිරීම.
- වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාව පිළිබඳව ඇගයීමක් සිදු කර, එය සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

1.1.3 අධ්‍යක්ෂ මණ්ඩලය

1. දිප්ති කුලරත්න මහතා (සභාපති)
2. ආචාර්ය අසේල ගුණවර්ධන මහතා
3. ආචාර්ය ලක්මිණී එන්. මාගොඩරත්න මහත්මිය
4. එවි. එම්. තේජා හේරත් මහත්මිය
5. ප්‍රනීත් මහල්ල මහතා
6. ආචාර්ය විත්‍තමාලි ද සිල්වා මහත්මිය
7. ආර්. එම්. පී. එස්. අබේරත්න මහතා

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
තනූජා ප්‍රියදර්ශනී අල්විස් මහත්මිය

1.1.4 විගණක

ජාතික විගණන කාර්යාලය
අංක 306 / 72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

1.1.5 බැංකුකරුවන්

ලංකා බැංකුව,
ජා ඇල.

1.1.6 නිකුත් කිරීම සඳහා බලය ලත් දිනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවට අනුව, 2020 දෙසැම්බර් මස 31 වන දිනට අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම පිණිස අවසර ලබා දෙන ලදී.

1.1.7 සකස් කිරීමේ පදනම

සමාගමේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව සකස් කරනු ලැබ ඇත. සාධාරණ අගය මත ගැනෙන වටිනාකමින් මනිනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් හැර ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම් ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් ඒවා යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකරණය සිය විනිශ්චයමතිය ක්‍රියාවට නැංවීමේ ද අවශ්‍ය වන්නේ ය. ඉහළ මට්ටමේ විනිශ්චයමතියක් අදාළ වන හෝ සංකීර්ණතාවයක් ඇතිවන ක්ෂේත්‍ර හෝ සමාගමේ මූල්‍ය ප්‍රකාශ සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කරනු ලැබ ඇත.

අ. අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, පදනම් සහ සටහන් (''මූල්‍ය ප්‍රකාශ'') සමඟ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී වරුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලවය.

ආ. නිර්ණය කිරීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ අගය සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණය කිරීම් සිදු කරනු ලබන අවස්ථාවන්හි දී හැර, මෙම මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

ඇ. සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන කාල සීමාව තුළ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමේ සහ අන්තර් කාල සීමා තුලනාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, එම මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පෙර වර්ෂයේ සියලුම වටිනාකම් සම්බන්ධයෙන් ගුණාත්මක, විස්තරාත්මක සහ ව්‍යක්ත තොරතුරු ඇතුලත් සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ.

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් යම් අයුරකින් දක්වා ඇති අවස්ථාවක දී හැරුණු කොට, මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාල සීමාවන් සඳහා අඛණ්ඩව අදාළ කරගනු ලැබ ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත විෂයයන්හි ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය කිරීම සංශෝධනය කරනු ලැබ ඇති අවස්ථාවක දී, මනා ඉදිරිපත් කිරීමක් සිදු කිරීම පිණිස වත්මන් වර්ෂය හා අනුකූල වීම සඳහා සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණයට ලක් කරනු ලැබ ඇත.

ඈ. කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ වලංගු මුදල

සමාගමේ කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ වලංගු මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.

ඉ. ප්‍රධාන ඇස්තමේන්තු සහ වැදගත් තීන්දු භාවිත කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගත වූ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම මඟින් කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හි ගිණුම්කරණ ප්‍රතිපත්ති වල භාවිතය හා වාර්තාගත වටිනාකම් කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ස්වරූපයේ තීන්දු ගැනීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ පුර්ව නිගමනවලට එළඹීම අපේක්ෂා කෙරේ. තථ්‍ය ප්‍රතිඵල, මෙම ඇස්තමේන්තු වලින් සහ යොදා ගන්නා ලද නිගමනවලින් වෙනස් විය හැකි ය. ඇස්තමේන්තු සහ පාදක කර ගත් පූර්ව නිගමන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුව සංශෝධනය කරනු ලබන කාල සීමාව තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු

වලට සිදු කරනු ලබන සංශෝධන හඳුනා ගනු ලබන්නේ, එම සංශෝධනය එම කාල සීමාව සඳහා පමණක් බලපාන්නේ නම් හෝ එකී සංශෝධනය වර්තමාන සහ අනාගත කාල සීමා දෙකටම බලපාන්නේ නම්, එම සංශෝධන කාල සීමාව සහ අනාගත කාල සීමාවන් තුළදී ය.

ඊ. ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

නුදුරු අනාගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම නොකඩවා පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සෑහීමට පත් වෙමින්, ඒ අනුව, සමාගම ක්‍රියාත්මක තත්වයේ පවත්වාගෙන යාමේ උපකල්පනය නුදුරු අනාගත කාල සීමාව තුළ නොකඩවා යොදාගත හැකි බවට ද සහතික වෙයි.

1.2 වත්කම් සහ එම වත්කම් තක්සේරු කිරීමේ පදනම්

1.2.1 දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ

අ. හඳුනා ගැනීම සහ ඇගයීම

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද සාධාරණ අගය යටතේ සහ වෙනත් යම් දුබලතා අලාභ යටතේ දක්වා ඇත.

සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ විෂයයන් මූලික වශයෙන් පිරිවැය යටතේ හෝ සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද පිරිවැය යටතේ සහ යම් දුබලතා අලාභ යටතේ වාර්තා කර ඇත. වත්කමක වැදගත් අංග හඳුනා ගෙන, වෙන වෙනම ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. දේපළ, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල වැදගත් අංග අන්තර් කාලය තුළ ආදේශ කරනු ලැබීමට අවශ්‍ය වන්නේ නම්, ආයතනය විසින් එම ආදේශ කළ කොටස බැහැර කරන අතර, නව කොටසෙහිම ප්‍රයෝජ්‍ය ජීව කාලය සහ ක්ෂය වීම් සමඟ එම කොටස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය පැන නඟිනු ලබන පරිදි, ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ආ. පිරිවැය

දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවල පිරිවැය, ඒවා මිලදී ගත් මිල සහ එයින් අපේක්ෂිත කාර්යය උදෙසා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම පිණිස සෘජුවම දරන ලද වෙනත් පිරිවැයෙන් සමන්විත වේ.

ඉපැයීමේ ධාරිතාව පවත්වාගෙන යාමේ හෝ ඉහළ නැංවීමේ අරමුණින්, ස්ථිර ස්වරූපයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන පසු කාලීන වියදම්, ප්‍රාග්ධන වියදම් සේ සලකනු ලැබ ඇත.

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ පරීක්ෂා කිරීමේ වියදම් ඇතුලත්, වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරනු ලබන දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ යක එක් අංගයක් ආදේශ කිරීම සඳහා දරනු ලබන වියදම, ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. වෙනත් පසු කාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ, එම අංගයේ ඇතුලත් ඉදිරි ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ හැකියාවක් පවතී නම් සහ එහි පිරිවැය යථාර්ථවාදී ලෙස ගණනය කළ හැකි නම් පමණි.

ඇ. ප්‍රත්‍යාගණනය කිරීම

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය සතු සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය කරන ලදි. (එම තක්සේරු වාර්තාව 2020 දී ලැබුණු අතර ඒ අනුව සියලුම දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනයට 2020 වර්ෂයේ දී ලක් කරන ලදී)

ඈ. ක්ෂය කිරීම්

වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය මත එම වත්කම්හි පිරිවැය ඉවත් කිරීම පිණිස, පහත සඳහන් වටිනාකම් යටතේ සරල මාර්ග පදනම (straight-line basis) මත වාර්ෂිකව, ප්‍රාග්ධන සංචිතය වෙත ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ.

ගොඩනැගිලි	අවුරුදු 20 ට වැඩි
පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 10 ට වැඩි
මෝටර් රථ	අවුරුදු 05 ට වැඩි
උපකරණ හා මෙවලම්	අවුරුදු 05 ට වැඩි
විද්‍යාගාර උපකරණ	අවුරුදු 10 ට වැඩි
කෘෂිකාර්මික උපකරණ	අවුරුදු 10 ට වැඩි
විදුලි වැඩ	අවුරුදු 05 ට වැඩි
කාර්යාල උපකරණ	අවුරුදු 10 ට වැඩි
ලී බඩු සහ සවි කිරීම්	අවුරුදු 10 ට වැඩි
පරිගණක උපකරණ	අවුරුදු 04 ට වැඩි
අස්පෘශ්‍ය වත්කම්	අවුරුදු 04 ට වැඩි

නියුට්බාර් යන්ත්‍රෝපකරණ ස්ථාපන කටයුතු ක්‍රියාවලිය 2021 දී අවසන් කිරීමට නියමිත හෙයින් එහි පිරිවැය ක්ෂය කිරීමේ කටයුතු සම්පූර්ණ නොකෙරුණි.

ඉ. හඳුනා නොගැනීම

බැහැර කරන විට දී හෝ භාවිතයෙන් කිසිදු ඉදිරි ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරනු ලබන අවස්ථාවක දී, දේපළක, පිරියතක සහ යන්ත්‍රෝපකරණයක අංගයක් හඳුනා නොගනු ලැබූ සේ සැලකේ. වත්කම් හඳුනා නොගැනීම මත හිමි වන ඕනෑම ලාභයක් හෝ පාඩුවක්, එම හඳුනා නොගැනීම සිදු කරනු ලබන වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ඇතුලත් කරනු ලැබේ.

1.2.2 කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ

කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ පිරිවැයෙහි දක්වනු ලැබේ. මෙම වියදම්, ප්‍රාග්ධනීකරණය වීමට ඇති ගොඩනැගිලි ඉදි කිරීමේ දී සෘජුවම හට ගන්නා ප්‍රාග්ධන ස්වරූපයක වියදම් වේ. භාවිතයේ පවතින ප්‍රාග්ධනය, භාවිතය සඳහා ලබා ගත හැකි අවස්ථාවේ දී, අදාළ දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වත්කම් වර්ගීකරණයට මාරු කරනු ලැබේ. එනම්, සමාගම විසින් අපේක්ෂිත අයුරින් ඒ සඳහා ක්‍රියාත්මක වීමට හැකි ආකාරයෙන් එය පිහිටා ඇති අවස්ථාවේ දී සහ අවශ්‍ය තත්ත්වයෙන් පවතින අවස්ථාවේ දී ය. කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ, යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ණය ගැනුම් පිරිවැය ඇතුළත්ව, ගත් මිලට දක්වනු ලැබේ.

1.2.3 අස්පෘශ්‍ය වත්කම්

වත්කම් වෙන ලැබෙන ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 අස්පෘශ්‍ය වත්කම්හි පරිදි වත්කමෙහි පිරිවැය යථාර්ථවාදී ලෙස ඇගයීමේ හැකියාවක් පවතී නම්, එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. ඒ අනුව, මෙම වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත දුබලතා අලාභ අඩු කළ ගත් මිලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සඳහන් කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග වර්ෂ 4 ක කාල සීමාවක් පුරා සරල මාර්ග ක්‍රමය මත ක්‍රමක්ෂය කර ඇත.

වර්ෂ 4 ක කාල සීමාවක් පුරා සරල මාර්ග ක්‍රමය මත විෂය මාලා පරිපාටි සංවර්ධනය කිරීමේ පිරිවැය ලියා අස්කර තිබේ.

1.2.4 වට්ටෝරු භාණ්ඩ ලේඛන

කල් ඉකුත් වූ සහ අඩු ක්‍රියාකාරී අයිතම සඳහා නිසි ඉඩ ලබා දීමෙන් අනතුරුව, සාමාන්‍ය පිරිවැය යටතේ වට්ටෝරු භාණ්ඩ ලේඛන ඇගයීම පළමුව පැමිණ පළමුව පිටවන පදනම **(FIFO)** මත සිදු කරනු ලැබේ. ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන මිලයි.

වට්ටෝරු භාණ්ඩ ලේඛන වත්මන් ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒමේදී දරනු ලබන පිරිවැය, පහත සඳහන් සූත්‍ර භාවිත කරමින් ගිණුම් ගත කරනු ලැබේ

අමු ද්‍රව්‍ය	- ගත් මිලට
කෙරෙමින් පවතින වැඩ	- ගත් මිලට
නිම කළ භාණ්ඩ	- සෘජු ද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැය යටතේ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම්ව ස්ථිර නිෂ්පාදිතයේ යෝග්‍ය සමානුපාතිකයක් සඳහා වියදම් වෙන් කිරීම් සිදු කරනු ලබයි.

ලබා ගත හැකි දළ වටිනාකම වනුයේ, සාමාන්‍ය වෙළෙඳපොළ තුළ, භාණ්ඩ ලේඛනය සකස් කිරීම අවසන් වූ පසු ඇස්තමේන්තුගත පිරිවැයට අඩු සහ විකිණීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය යටතේ වන ඇස්තමේන්තු ගත විකුණුම් මිලයි.

1.2.5 වත්කම් දුබලතාවයට පත්වීම

දුබලතාවයට පත්වීම පිළිබඳ යම් සඳහනක් වේ දැයි නිර්ණය කිරීම සඳහා සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්හි ප්‍රවාහන පිරිවැය සමාලෝචනය කරනු ලැබේ. එවැනි සඳහනක් වුවහොත්, නැවත ලබා ගත හැකි වත්කම් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. දුබලතාවයට අලාභයක් හඳුනා ගනු ලබන්නේ, යම් වත්කමක ප්‍රවාහන පිරිවැය හෝ මුදල් ජනනය කිරීමේ ඒකකය, එහි නැවත ලබා ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම් ය. නැවත ලබා ගත හැකි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා භාවිත කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත්නම්, දුබලතා අලාභය නැවත හරවාලනු ලැබේ.

1.2.6 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ පවත්නා මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු, කල් පිරීමට නියමිත ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයක් යටතේ වන මූල්‍ය වත්කම් ලෙස හෝ යෝග්‍ය පරිදි, ඵලදායී සීමාවක් තුළ සීමා කිරීමේ උපකරණ ලෙස සලකනු ලබන ව්‍යුත්පන්න ලෙස හෝ වර්ගීකරණය කරනු ලැබේ. සමාගම විසින් පළමු අවස්ථාවේදී ම, සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය පිළිබඳව නිර්ණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම් අතිරික්තය යටතේ හඳුනා ගනු ලබන්නේ, ගණුදෙනු පිරිවැය සඳහා සෘජුවම බලපෑම් කරනු ලබන, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් යටතේ වත්කම් නොවනු ලබන අවස්ථාවක දී ය.

සමාගම විසින්, ඔවුන් සිය සමාගම ස්ථාපිත කළ දිනයේ සිට ණය, ලැබිය යුතු සහ තැන්පතු හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ දක්වා ඇති වත්කම් ඇතුලත්ව) මූලිකව හඳුනා ගනු ලබන්නේ, වෙළඳ ගිවිසුමෙහි ගිවිසුම්ගත විධිවිධාන සඳහා සමාගම විසින් පාර්ශ්වකරුවකු වනු ලබන වෙළඳ දිනයේ දී ය.

වත්කමකින් ලැබෙන මුදල් ප්‍රවාහ සඳහා ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වූ විට, සමාගම විසින් එම මූල්‍ය වත්කම බැහැර කරනු ලබන අතර, එමඟින් මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීම උදෙසා, සාරානුකූලව මූල්‍ය වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දෙනු ලබන ගණුදෙණුවක් හරහා එම අයිතිය මාරු කරනු ලැබේ. සමාගම විසින් ඇති කරනු ලබන හෝ රඳවා තබා ගනු ලබන, පවරන ලද මූල්‍ය වත්කම්හි ඕනෑම පොලියක්, වෙන් වෙන් වශයෙන් වත්කමක් හෝ වගකීමක් සේ හඳුනා ගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් කපා හැරීමක් වන අතර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ එම ශුද්ධ අගය ඉදිරිපත් කරනු ලබන්නේ, එම අගයන් කපා හැරීමට සමාගම සතුව නෛතික අයිතියක් පවතින විට සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ වත්කම අත්පත් කොට ගෙන, ඒ හා සමගාමීව වගකීම නිරවුල් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණකි.

සමාගමේ මූල්‍ය වත්කම් තුළ මුදල්, කෙටි කාලීන ආයෝජන, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

අ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ පවතින මූල්‍ය වත්කම් තුළ වෙළඳාම සඳහා දරන ලද මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත වර්ගීකරණයට ලක් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා දරන ලද්දේ යයි වර්ගීකරණය කරනු ලබන්නේ, ආසන්නතම කාල සීමාව තුළදී විකිණීමේ හෝ නැවත මිලදී ගැනීමේ අරමුණින්, එම වත්කම් අත්පත් කරගනු ලබන්නේ නම්ය.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූල්‍ය වත්කම්, විස්තිර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම තුළ හඳුනා ගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් සමඟ සාධාරණ වටිනාකම යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ දක්වාලනු ලැබේ.

සමාගම විසින් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් යටතේ මූලික හඳුනා ගැනීම මත කිසිදු මූල්‍ය වත්කමක් වර්ගීකරණය කර නොමැත.

ආ. ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු, ක්‍රියාකාරී වෙළඳපොළක් තුළ මතු කොට දක්වා නොමැති, ස්ථිර හෝ ලැබේ යයි සැලකිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ඇගයීමෙන් අනතුරුව, භායන අඩු කර ඵලදායී පොලි අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ පසුව අගයනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ, අත්පත් කරගැනීම මත ලද වට්ටම් හෝ වාරික සහ ඵලදායී පොලි අනුපාතයෙහි වැදගත් කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගැනීමෙනි. ඵලදායී පොලි අනුපාත ක්‍රමක්ෂය විස්තිර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තිර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

ලැබිය යුතු වෙළඳ ආදායම්, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, වෙනත් ලැබිය යුතු සහ මුදල් සහ මුදල් සමාන දෑ ආදියෙන් ණය සහ ලැබිය යුතු ආදායම් සමන්විත වේ.

ඇ. කල් පිරීමට නියමිත ආයෝජන

ස්ථිර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල් පිරෙන තැන්පතු හා බැඳි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, සමාගම විසින් ධනාත්මක අදහසකින් පසු වන සහ කල් පිරෙන තෙක් ඒවා රඳවා තබා ගැනීමේ හැකියාව සමාගම සතු වූ විට, කල් පිරීමට නියමිත ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික ඇගයීමෙන් අනතුරුව, දුබලතා ඌණ ඵලදායී පොලි අනුපාත (EIR) ක්‍රමවේදය භාවිත කරමින්, එවැනි කල් පිරීමට නියමිත ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ අගයනු ලැබේ. ඵලදායී පොලි අනුපාත ක්‍රමක්ෂය විස්තිර්ණ ආදායම් ප්‍රකාශයෙහි සඳහන් මූල්‍ය ආදායම තුළ හඳුනා ගනු ලැබේ. දුබලත්වය හේතුවෙන් පැන නගින අලාභ, මූල්‍ය පිරිවැයෙහි සඳහන් විස්තිර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.
රජයේ සුරුකුම් පත් සහ ස්ථිර තැන්පතුවල කරනු ලබන ආයෝජන, කල් පිරීමට නියමිත ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත.

ඈ. විකිණීමට හැකි මූල්‍ය ආයෝජන

විකිණීමට හැකි ලෙස හෝ ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණ කිසිවක් තුළ වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, විකිණීමට හැකි මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, එම වත්කම් සාධාරණ වටිනාකම හා එහි වෙනස්කම් අනුව අගයනු ලබන අතර, දුබලතා අලාභ හැර වෙනත් විස්තිර්ණ ආදායම් තුළ හඳුනා ගනු ලබන අතර, අරමුදල් සහ සංචිත වල තැන්පත් කර ඇති සාධාරණ වටිනාකමින් ඉඳිරිපත් කරනු ලැබේ. විකිණීමට හැකි ණය සුරුකුම් මත පොලි ආදායම ඵලදායී පොලි අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් ගණනය කරනු ලබන අතර, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. යම් ආයෝජනයක් හඳුනා ගනු නොලැබූ විට, අරමුදල් හා සංචිත තුළ සමුච්චිත ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ ගිණුමෙහි නැවත වර්ගීකරණය කරනු ලැබේ.

මූලික හඳුනා ගැනීම මත, සමාගම විසින් කිසිදු මූල්‍ය වත්කමක් විකිණීමට හැකි ආයෝජනයක් ලෙස හඳුනා ගනු ලැබ නොමැත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 මූල්‍ය උපකරණ

මූල්‍ය මෙවලම් යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 වෙනුවට මූල්‍ය මෙවලම් යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 ආදේශ වේ : වර්ගීකරණය සහ මානනය කිරීම, දුබලත්වයට පත්වීම වීම සහ ප්‍රාවිකරණ (හෙජ්) ගිණුම්කරණය යන මූල්‍ය මෙවලම් සඳහා වූ අංශතුයම එකට ගෙන එමින් 2018 ජනවාරි මස 1 වන දිනයට හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා භඳුනා ගැනීම සහ මානනය කිරීම.

සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 සම්මත කර ගත්තේ සම්පූර්ණ අතීතානුසාරී ක්‍රමය භාවිතා කරමිනි. සිදු කරන ලද තක්සේරුව මත පදනම්ව, සමාගමේ මූල්‍ය ප්‍රකාශවලට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 විශාල බලපෑමක් ඇති නොකරන බව සමාගම නිගමනය කර ඇත.

වර්ගීකරණය සහ මානනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 යටතේ, වෙළඳ ලැබිය යුතු මුදල් හැර, සමාගම ආරම්භක අවස්ථාවේ දී මූල්‍ය වත්කමක් මනිනු ලබන්නේ එහි සාධාරණ අගයට ය. ඊට අමතරව මානනයක් සිදු කෙරෙනුයේ, ලාභ හෝ අලාභ සහ ගනුදෙනු පිරිවැය හරහා සාධාරණ අගය මත ගණනය නොවූ මූල්‍ය වත්කම් සම්බන්ධයෙනි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 9 යටතේ, ණය මූල්‍ය මෙවලම්, ලාභ හෝ අලාභය හරහා සාධාරණ අගයක් මතත්, ක්‍රමක්ෂය කළ පිරිවැය හෝ වෙනත් විස්තිරණ ආදායම හරහා වූ සාධාරණ අගයක් මතත් පසු අවස්ථාවක දී මනිනු ලැබේ. මෙම වර්ගීකරණය, නිර්ණායක දෙකක් මත පදනම් වේ. එනම්, වත්කම් කළමනාකරණය සඳහා වූ සමාගමේ ව්‍යාපාර ආකෘතිය මත: සහ මෙවලම්වල කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහයන්, පරියේෂව ඇති "මුල් මුදල මත මුල් මුදල හා පොලි මුදල පමණක් වූ ගෙවීම්" නියෝජනය කරන්නේ ද යන්න මත.

2018 ජනවාරි මස 1 වන දින මූලික අයදුම් කිරීමේ දිනය වන විට ආයතනයේ ව්‍යාපාර ආකෘති තක්සේරුව සිදු කරන ලද අතර, පසුව, එය, 2018 ජනවාරි මස 1 වන දිනට පෙර භඳුනා නොගත් මූල්‍ය වත්කම් සඳහා අතීතයට ද බලපාන පරිදි යොදන ලදී. ණය මෙවලම් මත කොන්ත්‍රාත් ගත මුදල් ප්‍රවාහයන්හි තක්සේරු කිරීම, හුදෙක් මූලික මුදල හා පොලි මුදල්වලින් පමණක් සමන්විත වන්නේ ද යන්න පදනම් වූයේ, වත්කම්වල ආරම්භක භඳුනා ගැනීමේ දී ඇති කරුණු සහ තත්වයන් මත ය.

සමාගමේ මූල්‍ය වගකීම් සඳහා වූ ගිණුම්කරණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ පැවති ආකාරයටම බොහෝ දුරට පවති.

1.2.7 මූල්‍ය වත්කම් දුබලත්වයට පත්වීම

සමාගම විසින් සෑම වාර්තා කරනු ලබන දිනකදීම, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්වී ඇති බවට භරශාඅ්මඅ ඖඅ්ඖ පවතිදැයි අගයනු ලබන අතර, එවැනි දුබලත්වයක් ඵිදු ටී ඇත්නම්, එම දුබලු වී ඇති ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ, වත්කම් දැරීමේ වටිනාකම සහ ඇස්තමේන්තු ගත ඉදිරි මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගනිමිනි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 සම්මත කිරීම මගින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 තුළ පැවති සිදු වූ අලාභ ආශ්‍රිත ප්‍රවේශය වෙනුවට ඉදිරි දැක්මක් සහිත අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශයක් ප්‍රතිස්ථාපනය වීමෙන් මූල්‍ය වත්කම් සඳහා වූ දුබලතා අලාභ පිළිබඳ සමාගමේ ගිණුම්කරණය මූලික වශයෙන් වෙනස් කරනු ලැබ ඇත.

සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් වෙනුවෙන් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය මත පවත්වා නොගැනෙන අපේක්ෂිත ණය අලාභ සඳහා යම් ඉඩ හැරීමක් සටහන් කර තැබීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 නියම කරයි.

අපේක්ෂිත ණය අලාභ පදනම් වනුයේ, කොන්ත්‍රාත්තුවට අනුව ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ ආයතනය වෙත ලැබෙතැයි අපේක්ෂා කරන සියලුම මුදල් ප්‍රවාහ අතර වෙනස මත ය. කිසියම් අඩුවක් ඇත්නම්, එය, වත්කම්වල මුල් ඵලදායී පොලි අනුපාතයට ආසන්න වන පරිදි පසුව වට්ටම් කරනු ලැබේ.

වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සඳහා ප්‍රමිතයේ සරල ප්‍රවේශය ආයතනය විසින් යොදා ගගනු ලැබිය යුතු අතර අපේක්ෂිත ණය අලාභ, ඒවායේ ආයු කාලය තුළ අපේක්ෂිත ණය අලාභ මත පදනම්ව ගණනය කළ යුතු වන්නේ ය.

1.2.8 මුදල් සහ මුදල් හා සමාන දෑ

අතැති මුදල්, බැංකු තැන්පතු, ස්ථාවර තැන්පතු සහ නැවත මිලදී ගැනීමේ ගිවිසුම් යනාදියෙන් මුදල් සහ මුදල් සාම්‍යයන් සමන්විත වේ.

1.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන වගකීම් වනුයේ, ඉල්ලීම මත හෝ වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයක් තුළ ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ය. වාර්තා කරනු ලබන දින සිට එක් වර්ෂයකට පසු ගෙවීම සඳහා හිඟ ලෙස පවතිනු ලබන ශේෂයන් ජංගම නොවන වත්කම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, දත් සියලුම වගකීම් සලකා බලනු ලැබේ. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සාධනීය වගකීමක් සමාගම සතුවන අවස්ථාවේ දී, ප්‍රතිපාදන සහ වගකීම් හඳුනා ගනු ලබන අතර, මෙම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇත.

1.3.1 සේවක ප්‍රතිලාභ

අ. විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

ශ්‍රී ලංකා ගිණුම්කරණ 19 යන සේවක ප්‍රතිලාභල ප්‍රමිතය සමාගම විසින් අනුගමනය කරනු ලැබ ඇති අතර සමාගමේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමට විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදු කිරීම සඳහා ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය භාවිතා කර ඇත.

මෙම ප්‍රතිපාදන ගණනය කිරීමේදී භාවිත කරනු ලබන මූලික පූර්ව නිගමන තුළ පහත දැක්වෙන කරුණු ඇතුලත් වේ :

වට්ටම් අනුපාතය	12%
ඉඳිරි වැටුප් වැඩිවීම් අනුපාතය	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම	02%
විශ්‍රාම ගැනීමේ වයස	අවුරුදු 55

සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

ආ. නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්ම පශ්චාත් සේවා නියුක්ති සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් විසින් වෙනත් යම් ආයතනයක් වෙත ස්ථිර දායකත්වයක් ගෙවනු ලබන අතර, අමතර වටිනාකමක් ගෙවීම සඳහා ඊට කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් හිමි නොවනු ඇත. නිශ්චිත දායකත්ව සැලැස්ම සඳහා වන දායකත්ව වෙනුවෙන් වන වගකීම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හිඟ ලෙස පෙන්නුම් කෙරෙන පරිදි සහ ඒවා නියමිත වන්නා වූ අවස්ථාවන්හි දී එම ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ඇ. සේවක අර්ථසාධක අරමුදල

එක් එක් සේවකයකුගේ වැටුප මත සමාගම සහ සේවකයා විසින් පිළිවෙළින්, 15% හා 10% බැගින් වන පරිදි, 2019 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට ඉඳිරියට සිය දායකත්වය අනුමත කරන ලද, අර්ථසාධක අරමුදල වෙත සලසා දෙනු ලැබේ.

ඈ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් විසින් එක් එක් සේවකයකුගේ වැටුප මත 3% ක් වූ ප්‍රමාණයක් අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත සිය දායකත්වය සලසා දෙනු ලැබේ.

1.3.2 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ගත් මිල මත සඳහන් කරනු ලැබේ.

1.3.3 බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත 2018.04.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබ ඇත. ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන, මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කරනු ලැබ ඇති ආදායම් හා වියදම් මූලාංගයන් මත පදනම් වන අතර 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලට හා ඊට ඉන් පසුව සිදු කෙරෙන සංශෝධන අනුව ආදායම් බදු ආගණනය කෙරේ.

1.3.4 විලම්බිත බදුකරණය

විලම්බිත බද්ද සම්පාදනය කරනු ලබන්නේ, වත්කම් සහ වගකීම්වලට අයත් බදු පදනම්හි සහ අදාළ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වාර්තා කරන දිනයේ දී එකී වත්කම් සහ වගකීම්වල පවත්නා ඉඳිරියට රැගෙන යන අගය අතර තාවකාලික වෙනස්කම් මත පිහිටා වගකීම් ක්‍රමවේදය භාවිතා කරමිනි.

1.3.5 ප්‍රාග්ධන වගකීම් හා අවිනිශ්චිත වගකීම්

අවිනිශ්චිත වගකීම් යනු, ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු කළ නොහැකි හෝ නිසියාකාරව ගණනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් වලින් පමණක් පැවැත්ම සහතික කරනු ලැබිය හැකි වගකීම් ය.

මූල්‍ය ප්‍රකාශවලට සිදු කරන අදාළ සටහන්හි සමාගමේ ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම් අනාවරණය කරනු ලැබේ.

1.4 විස්තිර්ණ ආදායම් ප්‍රකාශය

ප්‍රාග්ධන සංචිතය (ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළව)

වර්ෂ 2011 සිට සෞඛ්‍ය අමාත්‍යාංශය, කෙයා (CARE) ආයතනය සහ ශ්‍රී ලංකා දුම්කොළ සමාගම විසින් ස්ථිර වත්කම් මත වැය කරන ලද අරමුදල්, ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සලකනු ලැබ ඇති අතර, ඒ අනුව, වර්ෂය සඳහා සමස්ත ක්ෂය කිරීම් සඳහා හිලව් කිරීම සිදු කරමින්, මෙම විෂයන්ට අදාළ ක්ෂය කිරීම් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වලට ඇතුලත් කරනු ලැබ ඇත.

1.4.1 ප්‍රදාන

යම් ප්‍රදානයක් ලැබෙන බවට සහ ඊට යාකොට ඇති කොන්දේසි හා අනුගත වනු ඇති බවට සාධාරණ සහතික වීමක් පවතින අවස්ථාවකදී රජයේ ප්‍රදාන හඳුනා ගනු ලැබේ.

සමාගම තුළ ඇති කෙරෙනු ලබන වියදම් වෙනුවෙන් ඒ වෙත පිරිනමනු ලබන ප්‍රදාන, එම වියදම් හඳුනා ගනු ලබන වර්ෂයේ ම විස්තිර්ණ ආදායම් ප්‍රකාශය තුළ ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ. යම් වත්කමක පිරිවැය සඳහා සමාගම වෙත ලබා දෙනු ලබන ප්‍රදාන, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

1.4.2 වියදම්

අ. දරන ලද පිරිවැය සහ සුවිශේෂී ආදායම් වර්ග ඉපැයීම් අතර සෘජු සබඳතාව මත පදනම්ව, විස්තිර්ණ ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගනු ලැබේ. සමාගමෙහි මෙහෙයුම් කටයුතුවල දී සහ කාර්යක්ෂම අවස්ථාවන්හි දී ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේ දී ඇති වන සියලුම වියදම්, එම වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේ දී ආදායම්හි ප්‍රතිපාර්ශ්වීය ලෙස අය කරගනු ලැබ ඇත.

1.4.3 මූල්‍ය වියදම් / ආදායම්

ආයෝජනය කරන ලද අරමුදල් සඳහා උපචිත පදනම මත ලද පොලියෙන් මූල්‍ය ආදායම සමන්විත වේ.

1.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය 07 හා අනුගතව සකස් කරනු ලැබ ඇත.

1.6 වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ සිදුවීම්

වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසුව මූල්‍ය ප්‍රකාශ තුළ ගැළපුම් හෝ අනාවරණ අවශ්‍ය වන්නාවූ සැලකිය යුතු සිදුවීම් කිසිවක් නොමැත.

1.7 නව ගිණුම්කරණ ප්‍රමිතීන්, සංශෝධන සහ අර්ථකථන

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, 2018 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන නව ප්‍රමිතීන් අනුගමනය කිරීමට හැර, පෙර මූල්‍ය වර්ෂය තුළ සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්තිවලට අනුකූල වේ. දැනටමත් නිකුත් කරනු ලැබ ඇති නමුත් මේ දක්වා බලාත්මක නොවන වෙනත් යම් ප්‍රමිතියක්, අර්ථකථනයක් හෝ සංශෝධනයක් සමාගම විසින් සම්මත කර ගනු ලැබ නොමැත.

(i) "මූල්‍ය මෙවලම් : හඳුනා ගැනීම සහ මානනය කිරීම" යන ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 39 දරන ප්‍රමිතියෙහි බහු වර්ගීකරණ සහ මිනුම් ආකෘතීන් වෙනුවට මූලින් වර්ගීකරණ කාණ්ඩ දෙකක් පමණක්, එනම්, ක්‍රමක්ෂගත පිරිවැය සහ සාධාරණ අගය යනුවෙන් පැවති තනි මාදිලියක් සහිත ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 9 යන "මූල්‍ය මෙවලම්" ප්‍රමිතිය ප්‍රතිස්ථාපනය වේ.

(ii) භාණ්ඩ හා සේවා සඳහා වන කොන්ත්‍රාත්තු ආවරණය කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 18 සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ආවරණය කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 11 වෙනුවට "ගනුදෙනුකාර භවතුන් සමග ගිවිසුම්වලින් ලැබෙන ආදායම" යන ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 15 දරන ප්‍රමිතිය ආදේශ වන්නේ ය. නව ප්‍රමිතිය පදනම් වී ඇත්තේ, භාණ්ඩයක හෝ සේවාවක පාලනය ගනුදෙනුකරුවකු වෙත පවරනු ලබන විට ආදායම හඳුනා ගැනීම යන මූලධර්මය මත ය. එබැවින් පාලනය පිළිබඳ සංකල්පය දැනට පවතින අවදානම් සහ ත්‍යාග පිළිබඳ සංකල්පය ප්‍රතිස්ථාපනය කරයි.

(iii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 1, එනම්, 'ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රථම වරට අනුගමනය කරම', ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 7, එනම්, 'මූල්‍ය මෙවලම් හෙළිදරව් කිරීම්' සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 19, එනම්, 'සේවක ප්‍රතිලාභ' සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 10, එනම්, 'ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ' සඳහා සිදු කරන ලද තව දුරටත් අදාළ නොවන සංශෝධන මගින් සංක්‍රාන්ති විධිවිධාන ආවරණය කරමින් අදාළ කෙටි කාලීන නිදහස් කිරීම් ඒ හරහා කපා හරියි.

(iv) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 16 එනම්, "කල් බදු", මූලික වශයෙන් බදුලාභීන් විසින් සිදු කරනු ලබන ගිණුම්කරණයට බලපානු ඇති අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත කල්බදුකර සියල්ලම පාහේ හඳුනා ගැනීමට එය හේතු වනු ඇත. ප්‍රමිතිය මගින් මෙහෙයුම් සහ මූල්‍ය කල්බදු අතර වත්මන් වෙනස ඉවත් කරන අතර වත්කමක් (කල් බදු දෙන ලද අයිතමය භාවිතා කිරීමේ අයිතිය) හඳුනා ගැනීමත්, අත්‍යන්ත වශයෙන් සියලුම කල්බදු කොන්ත්‍රාත්තු සඳහා කුලී ගෙවීම හා සම්බන්ධ මූල්‍ය වගකීමත් එමගින් අවශ්‍ය වේ. කෙටි කාලීන සහ අඩු වටිනාකමින් යුත් කල්බදු සඳහා විකල්ප නිදහස් කිරීම් පවතී.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 16 මගින් කල්බදු හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා වන මූලධර්ම ගෙන හැර දක්වා ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17 යටතේ, 'අඩු වටිනාකමක්' සහිත සහ මාස 12 හෝ ඊට අඩු බදු කාල සීමාවක් සහිත කෙටි කාලීන කල්බදු සඳහා වන නිදහස් කිරීම් කිපයක් හැර, මූල්‍ය කල්බදු සඳහා වූ ගිණුම්කරණයට සමාන තනි ශේෂ පත්‍ර ආකෘතියක් යටතේ සියලුම කල්බදු සඳහා බදුලාභීන් විසින් ගිණුම්ගත කිරීම් සිදු කරනු ලැබීම අවශ්‍ය වන්නේ ය. මෙම ප්‍රමිතිය 2019 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(v) කොටස් ලෙස වර්ගීකරණය කරන ලද මූල්‍ය මෙවලම් මත ලාභාංශවලින් උද්ගත වන ආදායම් බදු ප්‍රතිවිපාක හඳුනා ගත යුත්තේ, බෙදා හැරිය හැකි ලාභ උත්පාදනය කළ අතීත ගනුදෙනු හෝ සිදුවීම් අනුව හඳුනා ගනු ලැබූ කල්හි බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 වන "ආදායම් බදු" ප්‍රමිතියෙහි සංශෝධන මගින් පැහැදිලි කරයි. අදාළ ප්‍රමිතිය අළලා කළ වැඩිදියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(vi) යම් අදාළ සුදුසුකම් ලැබීමේ වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සඳහා හෝ විකිණීම සඳහා සූදානම් වූ පසු කිසියම් නිශ්චිත ණය ගැනීමක් නොගෙවා ශේෂව පවතී නම්, එය සාමාන්‍ය ණය ගැනීම්වල කොටසක් බවට පත් වන බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 වන "ණය ගැනීමේ පිරිවැය" අළලා කරන ලද සංශෝධන මගින් පැහැදිලි කරයි. අදාළ ප්‍රමිතියේ වැඩිදියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන දිනට හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

(vii) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය 3, එනම්, "ව්‍යාපාර සංයෝජිතය" යන්නට කළ සංශෝධන මගින් පැහැදිලි කර ඇත්තේ, ඒකාබද්ධ මෙහෙයුමක් වන ව්‍යාපාරයක පාලනය ලබා ගැනීම අදියර වශයෙන් සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාරික සංයෝජනයක් බවයි. ප්‍රමිතියේ වැඩිදියුණු කිරීම් 2019 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන ගිණුම්කරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12, එනම්, "ආදායම් බදු" හැරුනු විට, ප්‍රකාශිත ප්‍රමිතීන්ට කරන ලද සංශෝධන අනුගමනය කිරීම මගින් සමාගමේ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති වේයැයි අපේක්ෂා නොකෙරේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12, එනම්, "ආදායම් බදු" වල බලපෑම තව දුරටත් තක්සේරු කෙරෙමින් පවතී. එය, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කර එය හරහා සලකා බැලිය යුතු ය. ඵලදායී නොවන වෙනත් ප්‍රමිතීන් තවමත් නොමැති අතර වත්මන් හෝ අනාගත වාර්තාකරණ කාල පරිච්ඡේදවල දී සහ නුදුරේ දී සිදු විය හැකි අනාගත ගනුදෙනු සඳහා සමාගම කෙරෙහි සුවිශාල බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

1.8 විකිණීම සඳහා තබා ගන්නා ලද ජංගම නොවන වත්කම්

නිරන්තර භාවිතය හරහා නොව මූලිකව, බැහැර කිරීම මඟින් නැවත ලබා ගැනීමට අපේක්ෂිත ජංගම නොවන වත්කම්, විකිණීම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. විකුණුම සඳහා තබා ගන්නා ලද වත්කම් ලෙස වර්ගීකරණය කිරීමට ප්‍රථම වහාම, සමාගමෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුගතව යමින් මෙම වත්කම් නැවත ගණනය කරනු ලැබේ. ඉන් පසුව, එම වත්කම්හි වටිනාකමට අඩු වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම යටතේ එම වත්කම් ගණනය කරනු ලැබේ. විකිණීම සඳහා තබා ගන්නා ලද, මූලික වර්ගීකරණය කිරීම මත භායන පාඩු සහ නැවත ගණනය කිරීම මත ලද පසු කාලීන ලැබීම් හෝ පාඩු, ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනු ලැබේ. කිනම් හෝ සමුච්චිත භායන පාඩුවක් ඉක්මවා ලැබීම් හඳුනා ගනු නොලැබේ.

1.9 සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක ආශ්‍රිත විශ්ලේෂණය

ඉලක්ක 2 : ශූන්‍ය කුසගින්න
කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව අත් කර ගැනීම සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

2.1 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය
2030 වන විට, කුසගින්න නිමා කර, සියලුම මිනිසුන්ට, විශේෂයෙන්, දුප්පතුන්ට සහ ළදරුවන් ඇතුළු අවදානමට ලක්විය හැකි තත්වයන් තුළ සිටින පුද්ගලයින්ට, වසර පුරා ආරක්ෂිත, පෝෂ්‍යදායී සහ ප්‍රමාණවත් ආහාර සඳහා ප්‍රවේශය සහතික වීම.

2.1.1 දර්ශකය
මන්දපෝෂණය පැතිරීම.

2.2 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය
2025 වන විට, වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගේ වර්ධනය බාලවීම සහ මන්දනය පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් එකccs වූ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම ඇතුළුව 2030 වන විට, සියලුම ආකාරයේ මන්දපෝෂණය අවසන් කිරීම සහ නව යොවුන් වියේ ගැහැණු ළමයින්, ගර්භනී සහ කිරි දෙන කාන්තාවන් සහ වැඩිහිටි පුද්ගලයින් යන අයවළුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම.

2.2.1 දර්ශකය
වයස අවුරුදු 5 ට අඩු ළමුන් අතර වර්ගය අනුව (මන්දනය සහ අධික බර) මන්දපෝෂණය (උස අනුව බර >+2 හෝ <-2 සම්මත අපගමනය - ලෝක සෞඛ්‍යය සංවිධානයේ ළමා වර්ධන ප්‍රමිතිවල මධ්‍යස්ථය අනුව) පැතිර පැවතීම.

2.3 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය
ඉඩම්, අනෙකුත් නිෂ්පාදන සම්පත් සහ යෙදවුම්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපල සහ අගය එකතු කිරීම සහ ගොවිපල නොවන රැකියා සඳහා අවස්ථා යනාදී දැ හරහා ඒවා වෙත සුරක්ෂිතව හා සමාන ප්‍රවේශයක් ලබා දීම ඇතුළුව 2030 වන විට, කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්, ආදී වාසින්, පවුල් ගොවීන්, එඬේරුන් සහ ධීවරයින් අයගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම දෙගුණ කිරීම.

2.3.1 දර්ශකය
ලිංගිකත්වය සහ දේශීය තත්ත්වය අනුව, කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය ආදායම.

ඉලක්ක 9 : කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්
ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීම, අන්තර්ගතභාවය සහ තිරසර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම.

9.2 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය
අන්තර්ගතභාවය හා තිරසාර කාර්මිකරණය ප්‍රවර්ධනය කිරීම සහ 2030 වන විට, ජාතික තත්වයන්ට අනුකූලව, කර්මාන්තයේ රැකියා කොටස සහ දළ දේශීය නිෂ්පාදිතය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම සහ ඌණ සංවර්ධිත රටවල එහි කොටස දෙගුණ කිරීම.

9.2.1 දර්ශකය
- දළ ජාතික නිෂ්පාදිතයේ සහ ඒක පුද්ගල ආදායමේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අගය එකතු කිරීම.
- සමස්ත සේවා නියුක්තියේ ප්‍රතිශතයක් ලෙස රැකියා නිෂ්පාදනය.

9.4 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය
2030 වන විට, සියලු රටවල් තම හැකියාවන්ට අනුකූලව ක්‍රියා කරමින් යටිතල පහසුකම් සහ ප්‍රතිනිර්මිත කර්මාන්ත වැඩිදියුණු කිරීම, සම්පත් පරිභරණ කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ පිරිසිදු හා පරිසර හිතකාමී තාක්ෂණයන් සහ කාර්මික ක්‍රියාවලීන් වැඩි වශයෙන් භාවිතා කිරීම.

9.4.1 දර්ශකය
අගය එකතු කරන ලද ඒකකයකට CO2 විමෝචනය

9.5 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය
2030 වන විට නවෝත්පාදන දිරිමත් කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික පර්යේෂණ සහ සංවර්ධන වියදම් සඳහා වන පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ සංඛ්‍යාව යැළඳිය යුතු ලෙස වැඩි කිරීම ඇතුළුව, 2030 වන විට, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල, විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම, කාර්මික අංශවල තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම.

9.5.1 දර්ශකය
- දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස පර්යේෂණ සහ සංවර්ධන වියදම්.වැඩිදියුණු කිරීම.
- ජනගහනය මිලියනයකට පර්යේෂකයන් (පූර්ණ කාලීනව සමාන)

ඉලක්ක 12 : වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය
තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

12.5 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය
2030 වන විට, වැළැක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිතය තුළින් අපද්‍රව්‍ය උත්පාදනය සැලකිය යුතු ලෙස අඩු කිරීම.

12.5.1 දර්ශකය
ජාතික ප්‍රතිචක්‍රීකරණය අනුපාතය, ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍යය ටොන් ගණන.

12.7 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය
ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවලට අනුකූලව තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.

12.7.1 දර්ශකය
තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කරන රටවල් ගණනාවක්.

12 අ. අදාළ තිරසාර සංවර්ධන ඉලක්කය
සංවර්ධනය වෙමින් පවතින රටවලට වඩා තිරසාර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් කරා ගමන් කිරීම සඳහා ඔවුන්ගේ විද්‍යාත්මක හා තාක්ෂණික ධාරිතාව ශක්තිමත් කිරීමට සහාය වීම.

12 අ. 1 දර්ශකය
තිරසාර පරිභෝජනය හා නිෂ්පාදනය සහ පාරිසරික වශයෙන් යහපත් තාක්ෂණයන් සඳහා පර්යේෂණ සහ සංවර්ධනය උදෙසා සංවර්ධනය වෙමින් පවතින රටවලට ලැබෙන ආධාර ප්‍රමාණය.

	31/12/2020 රු. ශත	31/12/2019 රු.
02. ආදායම		
අයභාරය	1,447,012,627.73	2,441,399,695
ක්ෂය වීම	56,982,057.32	59,864,539
සුපෝෂ විකුණුම්	481,012,991.72	746,933,176
හයිලන්ඩ් නිෂ්පාදන විකුණුම්	6,817,300.00	19,222,565
ජා.ආ.ප්‍ර.ම. නිෂ්පාදන විකුණුම්	207,590.00	584,232
කපු විකුණුම් ආදායම	281,740.00	-
SDK නිෂ්පාදන විකුණුම්	857,805.00	880,860
බේකරි නිෂ්පාදන	2,430,600.00	2,494,590
	1,995,602,711.77	**3,271,379,657**

ආදායම

ඉහත ආදායම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන වියදම් ප්‍රතිපූරණ වලින් සහ සෘජු ගෙවීම් වලින් සමන්විත වේ.

ක්ෂය වීම

ක්ෂය වීම හැර අනෙකුත් සියලුම වියදම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපූරණ වන බැවින් ඉහත ක්ෂය වීම ආදායමක් (පොත් ඇතුළත් කිරීම) ලෙස සලකනු ලැබේ.

03. පරිභෝජනයට සූදානම් නිෂ්පාදනවල පිරිවැය		
2020.01.01 දිනට නිමවූ නිෂ්පාදන	-	5,010,672
මුළු නිෂ්පාදන පිරිවැය	1,467,445,466.99	2,465,813,916
2020.12.31 දිනට නිමවූ නිෂ්පාදන	-	-
	1,467,445,466.99	**2,470,824,588**
04. විකුණුම් පිරිවැය		
2020.01.01 දිනට ශේෂය	17,715,888.87	7,047,000
ලැබුණා - සුපෝෂ	349,122,184.88	539,945,170
ගැනුම් - හයිලන්ඩ් නිෂ්පාදන	5,655,458.33	16,099,653
ගැනුම් - ජා.ආ.ප්‍ර.ම. නිෂ්පාදන	187,105.76	459,096
ගැනුම් - SDK නිෂ්පාදන	622,576.00	848,648
ගැනුම් - බේකරි හා වෙනත්	1,097,558.60	-
ගැනුම් - කපු	277,397.50	-
	374,678,169.94	**564,399,566**
2020.12.31 දිනට ශේෂය	(17,342,122.13)	(17,715,889)
	357,336,047.81	**546,683,677**
05 වෙනත් ආදායම්		
අපතය විකුණුම්	12,614,476.57	23,849,965
නිවාස ණය පොලි	1,675,982.79	2,121,729
පොලි ආදායම	42,600.39	-
භාණ්ඩාගාර බිල්පත් මත පොලි	5,384,276.10	7,649,202
ස්ථාවර තැන්පතු මත පොලි	17,191,343.01	6,784,204
වෙනත්	2,216,092.01	10,036,559
	39,124,770.87	**50,441,659**

	31/12/2020 රු. ශත	31/12/2019 රු.
06 විකුණුම් හා බෙදාහැරීමේ වියදම්		
ප්‍රවාහන වියදම්	2,974,774.03	11,138,960
අලෙවි සැලේ වියදම්	855,214.44	2,049,939
මුද්‍රණ හා ප්‍රචාරණ	2,215,209.50	6,342,990
විකුණුම් කොමිස් හා වෙනත් වියදම්	12,268.75	715,629
ක්ෂය වීම	4,074,400.00	1,995,867
	10,131,866.72	**22,243,385**
07. පරිපාලන වියදම්		
වැටුප්	12,213,552.78	10,798,531
සේවක අර්ථසාධක අරමුදල	2,396,334.25	2,231,261
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	479,266.85	476,736
අතිකාල දීමනා	3,877,490.38	3,746,081
දීමනා	3,595,381.50	3,408,984
අනියම් වේතන	-	1,471,233
අනියම් වේතන මත සේ.අ.අ.	-	319,833
අනියම් වේතන මත සේ.නි. භා.අ.	-	47,975
කළමනාකරණ දීමනා	5,420,133.27	7,363,082
කාර්යමණ්ඩල සුබසාධනය	3,340,146.80	3,560,591
වරිපනම් සහ බදු	571,632.94	381,301
කාර්යාල උපකරණ නඩත්තු	1,192,242.61	1,410,700
ආරක්ෂක ගාස්තු	9,021,836.53	8,484,859
මෝටර් වාහන ඉන්ධන	2,025,177.84	3,706,757
මෝටර් වාහන අලුත්වැඩියා හා නඩත්තු	2,368,419.03	3,394,040
වෙනත් සේවා හා නඩත්තු	581,205.84	13,500
ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු	7,057,822.95	597,345
උද්‍යාන නඩත්තුව	9,530.00	-
තේ හා වෙනත්	35,043.00	21,455
රක්ෂණ	4,877,879.68	2,047,191
සිද්ධි කළමනාකරණ සේවා	-	33,078
ලිපි ද්‍රව්‍ය	1,673,358.64	1,072,403
තැපැල් ගාස්තු	135,000.00	155,000
දුරකථන ගාස්තු	437,588.40	521,407
කාර්යමණ්ඩල පුහුණු කිරීමේ ගාස්තු	680,207.00	22,923,595
නෛතික හා වෘත්තිය ගාස්තු	7,101,689.60	2,082,192
බලපත්‍ර හා රක්ෂණ ගාස්තු	1,098,938.16	1,159,792
වෛද්‍ය හා සනිපාරක්ෂක	522,351.16	518,455
ගමන් වියදම්	79,100.00	303,250
ප්‍රදාන	-	284,475
නිල ඇඳුම් - අලෙවි	43,725.00	27,575
දැරි දීමනා	13,874,338.49	14,717,471
ක්ෂය වීම	7,417,468.51	5,520,199
	92,126,861.21	**102,800,347**
08 මූල්‍ය හා වෙනත් වියදම්		
බැංකු ගාස්තු	23,250.00	1,065,643
වෙනත් වියදම්	47,428.01	68,580
බැංකු ණය පොලී	6,890,785.53	-
	6,961,463.54	**1,134,223**
09. ආදායම් බදු වියදම්		
ජංගම ආදායම් බදු වියදම්	13,830,144.76	-
එකතු කළා - විලම්බිත බදු වත්කම්	(333,079.41)	-
	13,497,065.35	-

	31/12/2020 රු. ශත	31/12/2019 රු.
10 මිලදී ගැනුම්		
බඩ ඉරිගු	449,569,591.44	779,898,384
සෝයා	303,677,640.00	757,894,661
කිරි පිටි	251,517,000.00	272,480,000
ඛනිජ ලවණ	36,018,950.00	70,035,225
විටමින්	38,550,600.00	75,700,763
පොලිතින් බෑග්	-	1,258,560
පොලිතින් රීල්	36,295,815.93	67,634,040
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	10,579,599.00	40,073,145
ටිවයින් නූල්	214,522.62	233,091
	1,126,423,718.99	**2,065,207,868**
11 සෘජු ශ්‍රම සහ කළමනාකරණ පිරිවැය		
වැටුප්	82,476,075.86	70,984,548
සේවක අර්ථසාධක අරමුදල	15,215,186.56	11,995,861
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	3,051,879.49	2,699,369
අතිකාල දීමනා	41,969,051.70	54,507,255
දීමනාව	21,190,637.70	24,509,247
පාරිතෝෂික	26,568,297.92	14,827,855
සේවාස්ථ ගෙවීම්	417,641.12	599,263
නිල ඇඳුම් සහ ලොන්ඩරි සේදුම්	4,214,097.63	4,297,742
තේ හා වෙනත්	3,529,836.59	4,043,283
සේවා මුර හා ආහාරපාන දීමනාව	1,734,616.00	2,777,829
වෛද්‍ය හා සනීපාරක්ෂක	3,739,141.86	1,031,413
අනියම් හා කොන්ත්‍රාත් වැටුප්	3,300,252.71	6,037,648
අනියම් හා කොන්ත්‍රාත් වැටුප් මත සේ.අ.අ.	571,439.39	1,036,935
අනියම් හා කොන්ත්‍රාත් වැටුප් මත සේ.නි.භා.අ.	113,940.69	246,503
සුබසාධන වියදම්	229,299.00	233,895
දිරි දීමනා	16,934,614.62	14,152,688
	225,256,008.84	**213,981,333**
12 කම්හල් පොදුකාර්ය පිරිවැය		
විදුලි ජනකය සඳහා ඉන්ධන	26,533,120.00	49,659,130
කම්හල් නඩත්තුව	1,934,250.00	1,908,747
පිරියත හා යන්ත්‍රෝපකරණ නඩත්තු	23,631,338.45	43,292,342
විද්‍යාගාර වියදම්	1,886,260.56	3,664,360
විදුලිය	23,698,356.52	35,297,047
ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු	3,352,208.03	4,983,894
වෙනත් සේවා හා නඩත්තු	9,592,306.25	11,624,958
උද්‍යාන නඩත්තුව	101,455.50	200,513
භාණ්ඩ අලාභ	-	291,032
ක්ෂය වීම	50,083,983.66	54,455,917
	140,813,278.97	**205,377,939**

13. දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය / ප්‍රත්‍යාගණනය	2019.12.31 දිනට ශේෂය	ප්‍රත්‍යාගණන ගැළපුම් 2019	එකතු කිරීම්	2020.12.31 දිනට ශේෂය
ඉඩම්	220,000,000	210,000,000.00	-	430,000,000.00
ගොඩනැගිලි	156,300,970	(750,970.45)	-	155,550,000.00
යන්ත්‍රෝපකරණ	472,084,345	(85,446,637.43)	207,160,327.21	593,798,034.92
මෝටර් රථ	41,767,000	(4,395,000.00)	-	37,372,000.00
ආම්පන්න හා උපකරණ	8,656,504	(2,009,734.05)	-	6,646,770.00
විද්‍යාගාර උපකරණ	9,646,402	(712,756.87)	46,631.00	8,980,276.54
විදුලි වැඩ	6,042,735	(1,382,734.76)	-	4,660,000.00
කාර්යාල උපකරණ	10,852,850	(2,551,289.75)	447,557.69	8,749,117.86
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	9,279,201	(1,674,708.34)	1,713,345.69	9,317,838.10
පරිගණක හා වෙනත් දෘඩාංග	10,428,500	(2,803,638.88)	677,481.00	8,302,342.00
	945,058,507	**108,272,529.47**	**210,045,342.59**	**1,263,376,379.42**

සමුච්චිත ක්ෂය කිරීම්	2019.12.31 දිනට ශේෂය	ප්‍රත්‍යාගණන ගැළපුම් 2019	වර්ෂය සඳහා අය	2020.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි	32,253,330	(26,447,194.26)	7,777,500.00	13,583,635.95
යන්ත්‍රෝපකරණ	188,085,587	(153,298,247.60)	39,520,399.49	74,307,738.47
මෝටර් රථ	24,204,367	(20,406,500.00)	7,474,400.00	11,272,266.67
ආම්පන්න හා උපකරණ	6,356,903	(5,735,662.34)	1,329,354.00	1,950,594.91
විද්‍යාගාර උපකරණ	3,663,635	(2,980,262.87)	894,530.33	1,577,902.76
විදුලි වැඩ	4,530,459	(3,540,461.30)	932,000.00	1,921,997.66
කාර්යාල උපකරණ	4,342,494	(3,405,290.73)	856,919.48	1,794,122.77
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	3,894,442	(3,255,779.48)	862,189.23	1,500,851.76
පරිගණක හා වෙනත් දෘඩාංග	6,017,521	(4,380,752.19)	1,928,559.64	3,565,328.67
	273,348,738	**(223,450,150.77)**	**61,575,852.17**	**111,474,439.62**

ලියා අඩු කළ අගය	2019.12.31 දිනට ශේෂය	2020.12.31 දිනට ශේෂය
	රු.	රු. ශත
ඉඩම්	220,000,000	430,000,000.00
ගොඩනැගිලි	124,047,640	141,966,364.05
යන්ත්‍රෝපකරණ	283,998,759	519,490,296.45
මෝටර් රථ	17,562,633	26,099,733.33
ආම්පන්න හා උපකරණ	2,299,601	4,696,175.09
විද්‍යාගාර උපකරණ	5,982,767	7,402,373.78
විදුලි වැඩ	1,512,276	2,738,002.34
කාර්යාල උපකරණ	6,510,356	6,954,995.09
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	5,384,759	7,816,986.34
පරිගණක හා වෙනත් දෘඩාංග	4,410,979	4,737,013.33
	671,709,769	**1,151,901,939.80**

14 වට්ටෝරු භාණ්ඩ	31/12/2020 රු. ශත	31/12/2019 රු.
අමු ද්‍රව්‍ය		
බඩ ඉරිගු	4,788,440.80	10,541,193
සෝයා	71,486,301.60	71,270,388
කිරි පිටි	26,841,000.00	4,260,000
ඛනිජ ලවණ	10,808,050.00	10,193,150
විටමින්	19,734,408.00	8,769,469
	133,658,200.40	**105,034,199**
ඇසුරුම් ද්‍රව්‍ය		
පොලිතින් රීල්	6,159,315.22	2,826,592
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	3,321,000.00	9,425,675
ටිවයින් නූල්	200,249.28	-
	9,680,564.50	**12,252,267**
වෙනත්		
ඩීසල්	2,342,080.00	2,747,160
ඉංජිනේරු ගබඩා	41,547,031.01	38,918,844
	43,889,111.01	**41,666,004**
කෙරෙමින් පවත්නා වැඩ		
අමු ද්‍රව්‍ය		
බඩ ඉරිගු	-	1,207,400
සෝයා	-	60,480
කිරි පිටි	736,000.00	260,000
ඛනිජ ලවණ	184,943.00	65,038
විටමින්	196,408.80	528,281
ඇසුරුම් ද්‍රව්‍ය		
පොලිතින් බෑග්	-	12,026
පොලිතින් රීල්	62,754.85	55,382
ක්‍රාෆ්ට් කඩදාසි බෑග්	1,771.20	3,543
ටිවයින් නූල්	5,761.14	248
	1,187,638.99	**2,192,398**
නිමි භාණ්ඩ		
ළමා	-	-
මාතෘ	-	-
	-	-
අලෙවි අංශය		
සුපෝෂ	581,283.20	274,572
ඇසුරුම් ද්‍රව්‍ය	16,246,546.88	16,782,678
හයිලන්ඩ් නිෂ්පාදන	514,292.05	381,960
කෙරෙමින් පවත්නා වැඩ	-	276,679
	17,342,122.13	**17,715,889**
එකතුව	**205,757,637.03**	**178,860,757**

	31/12/2020 රු. ශත	31/12/2019 රු.
15 වෙළඳ හා වෙනත් ලැබීම්		
ණයගැතියෝ	15,525,527.07	27,625,102
ණයගැතියෝ - අලෙවි	40,909,482.12	45,371,885
අත්තිකාරම් සහ පෙර ගෙවීම්	9,150,989.08	52,564,654
ලැබිය යුතු රක්ෂණ	424,658.28	541,161
තැන්පතු	2,001,000.00	2,026,000
නිවාස ණය - වත්කම්	38,160,679.36	35,416,951
නිවාස ණය - ආපදා	27,034,145.05	22,627,038
නිවාස ණය - 02	6,152.04	-
නිවාස ණය - 03	4,100,000.00	-
උත්සව අත්තිකාරම්	156,000.00	173,750
විනෝද චාරිකා අත්තිකාරම්	916,000.00	640,200
	138,384,633.00	**186,986,742**

15.1 අත්තිකාරම් සහ පෙර ගෙවීම්		
නියුට්‍රිබාර් නිපැයුම් යන්ත්‍රය සවිකළ ගොඩනැගිල්ල (කුමාර කන්ස්ට්‍රක්ෂන්)	5,183,833.17	
කාර්යාලය සඳහා නව සර්වර් යන්ත්‍රයක් සවි කිරීම (ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී)	1,027,620.00	
වෛද්‍යාධාර රක්ෂණය (ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්)	2,816,535.91	
වෙනත්	123,000.00	
	9,150,989.08	

16 මුදල් සහ මුදල් හා සමාන දෑ		
අතැති මුදල්	-	-
ලංකා බැංකුව, ජා-ඇල - ගිණුම් අංකය 71324617	101,983,382.71	16,524,816
ලංකා බැංකුව, ජා-ඇල - ගිණුම් අංකය 80306903	44,056,029.80	186,416,124
භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජන	92,750,236.27	92,587,214
ස්ථාවර තැන්පතු මත ආයෝජන	209,545,224.08	192,353,881
	448,334,872.86	**487,882,035**

16.1 භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජන - ප්‍රතිගැනුම් ගිවිසුම

මධ්‍යම තැන්පතු පද්ධති ගිණුම	2020.12.31 දිනට වාහක මුදල	2019.12.31 දිනට වාහක මුදල
RET-Y107471000 - 01	71,525,928.57	71,587,214
RET-Y107471000 - 02	21,224,307.70	21,000,000
	92,750,236.27	**92,587,214**

16.2 ස්ථාවර තැන්පතු මත ආයෝජන

ගිණුම් අංකය	2020.12.31 දිනට වාහක මුදල	2019.12.31 දිනට වාහක මුදල
83258807	6,456,912.65	6,038,877
82420963	5,057,483.10	4,724,583
81508819	19,340,672.16	18,062,417
81048092	5,300,881.20	4,955,762
80940675	13,388,026.80	12,521,968
80871912	14,776,216.07	13,811,639
80586829	6,870,455.12	6,416,376
82932526	50,000.00	50,000
85235518	138,304,576.98	125,772,260
	209,545,224.08	**192,353,881**

* ඉහත තැන්පතු ලංකා බැංකුවෙහි ආයෝජනය කර ඇත.

	31/12/2020 රු. ශත	31/12/2019 රු.
17 ප්‍රකාශිත ප්‍රාග්ධනය		
ප්‍රාග්ධන සංචිත	129,574,367.55	129,574,368
ප්‍රත්‍යාගණන සංචිත	175,025,632.45	175,025,632
	304,600,000.00	**304,600,000**

අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක ප්‍රතිඵලයක් ලෙස, ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරිත්වය, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සම්පූර්ණ රජය සතු පොදු සීමිත සමාගමක් වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව, රු. 304,600,000/= ක (රුපියල් තුන් මිලියන හයසිය දහසක) ප්‍රකාශිත ප්‍රාග්ධනය සහිතව 2010 සැප්තැම්බර් මස 17 වන දින ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

18 විලම්බිත වගකීම්		
වසර ආරම්භයේ ශේෂය	250,562,775.50	390,085,608
සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	5,775,732.85	37,125,391
ප්‍රකාශිත ප්‍රාග්ධනය	-	(129,574,368)
ප්‍රාග්ධන වත්කම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ අත්තිකාරම්	-	12,790,683
අඩු කළා : වර්ෂය සඳහා ක්ෂය අය කිරීම්	**(56,982,057.32)**	(59,864,539)
වර්ෂය අවසානයේ ශේෂය	**199,356,451.03**	**250,562,776**

19 ප්‍රත්‍යාගණන සංචිත		
වසර ආරම්භයේ ශේෂය	131,176,703.11	306,378,658
ප්‍රකාශිත ප්‍රාග්ධනය	-	(175,025,632)
ප්‍රත්‍යාගණනය	2,087,094.22	-
වත්කම් විකිණීම මත ප්‍රත්‍යාගණන ලාභය/අලාභය	329,635,586.03	(176,322)
වර්ෂය අවසානයේ ශේෂය	**462,899,383.36**	**131,176,703**

20 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		
වසර ආරම්භයේ ශේෂය	53,309,803.83	44,898,532
අඩු කළා : වර්ෂය තුළ ගෙවීම්	(4,775,089.50)	(6,416,584)
වර්ෂය සඳහා ප්‍රතිපාදන - 2020	26,568,297.92	14,827,855
වර්ෂය අවසානයේ ශේෂය	**75,103,012.25**	**53,309,804**

වට්ටම් ගත අනුපාතය	12%	12%
ඉඳිරි වැටුප් වර්ධක අනුපාතය	10%	10%
කාර්ය මණ්ඩල පිරිවැටුම්	2%	2%
විශ්‍රාම ගැනීමේ වයස	අවු. 55	අවු. 55

21 වෛද්‍යාධාර අරමුදල		
වසර ආරම්භයේ ශේෂය	246,836.57	209,447
වර්ෂය තුළ දායකවීම්	221,760.00	208,740
වර්ෂය තුළ ගෙවීම්	(149,973.75)	(171,350)
වර්ෂය අවසානයේ ශේෂය	**318,622.82**	**246,837**

22 ජංගම නොවන වගකීම්

කාල නිර්ණ ණයවර ලිපි ණය	23,437,500.00	-
	23,437,500.00	-

පොලි දරන ණය සහ ණය ගැනුම්

	2020			2019	
	වසරක් තුළ ගෙවිය යුතු	වසර 05 ට අඩු වසරකින් පසු ගෙවිය යුතු	ගෙවිය යුතු මුළු මුදල	වසරක් තුළ ගෙවිය යුතු	වසර 05 ට අඩු වසරකින් පසු ගෙවිය යුතු
කාල නිර්ණ ණය පහසුකම් - ලංකා බැංකුව	56,250,000.00	23,437,500.00	79,687,500.00	-	-
	56,250,000.00	23,437,500.00	79,687,500.00	-	-

කාල නිර්ණ ණය පහසුකම්	වසරක් තුළ ආපසු ගෙවිය යුතු	වසර 05 ට අඩු වසරකින් පසු ආපසු ගෙවිය යුතු	වසර 05 කින් පසු ආපසු ගෙවිය යුතු	2020.12.31 දිනට මුළු මුදල	2019.12.31 දිනට මුළු මුදල
	රු.	රු.	රු.	රු.	රු.
දිගු ණය - ලංකා බැංකුව	56,250,000.00	23,437,500.00	-	79,687,500.00	-
	56,250,000.00	23,437,500.00	-	79,687,500.00	-

ණය පහසුකමේ විස්තර - 01

ණය පහසුකමේ විස්තර - 01

පොලි අනුපාතය	ආපසු ගෙවුම් කොන්දේසි
ස්ථාවර තැන්පත් අනුපාතය + වාර්ෂික 2.0%	
ණය පොලි අනුපාතය + පළමු මාස 12 - වාර්ෂික 12.25%	මාසික වාරික 24
(ණය පොලි අනුපාතය + අවසන් මාස 12 - වාර්ෂික 7.50%)	

වෙනත් සම්බන්ධිත හෙළිදරව් කිරීම් - කාල නිර්ණ ණය

නියුට්‍රබාර් යන්ත්‍ර පිරිවැය (ඇ.ඩො.)	851,700.00
2019 දී විදුලි ප්‍රේෂණ මගින් ගෙවූ 20% අත්තිකාරම (ඇ.ඩො.)	170,340.00
2020 දී සදිසි ණයවර ලිපි මගින් ගෙවූ ශේෂ 80% (ඇ.ඩො.)	681,360.00

01. සදිසි ණයවර ලිපිය (ඇ.ඩො. 681,360.00) හරහා සිදු කරන ලද ගෙවීම සඳහා කාල නිර්ණ ණය මුදලක් ලබා ගැනීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

02. ණයවර ලිපි පහසුකම සඳහා ඇප (ICBS FD 85235518) වශයෙන් ලංකා බැංකුවේ ජා-ඇල ශාඛාවේ රු. මි. 125 ක් වූ ස්ථාවර තැන්පතු ගිණුමක් විවෘත කිරීමට පහසුකම් ලබා ගැනීම පිණිස මණ්ඩලය අවසර දී ඇත.

04. රු.මි. 112.50 ක් වූ කාල නිර්ණ ණය මුදලක් 2020.05.26 වන දින ලංකා බැංකුව විසින් ලබා දී ඇත. (බැඳුම්කර / ස්ථාවර තැන්පත් අගයෙන් 90%)

	31/12/2020 රු. ශත	31/12/2019 රු.
23 වෙළෙඳ, හා වෙනත් ගෙවීම් නියමිත		
ණය හිමියන්	18,632,161.08	69,466,432
වැටුප් පාලන ගිණුම	493,440.95	401,670
ගෙවිය යුතු වැට් බදු	1,009,158.13	-
ගෙවිය යුතු ආදායම් බදු	13,830,144.76	-
කාල නිර්ණ ණය	56,250,000.00	-
ගෙවිය යුතු තැන්පතු	56,903,737.50	57,203,238
සෞඛ්‍ය අමාත්‍යාංශය	108,832.88	57,947,331
	147,227,475.30	**185,018,670**
24 පූර්ව වර්ෂ ගැළපුම්		
වියදම්	-	(1,420,800)
ලැබිය යුතු රක්ෂණ	725.98	-
ස්ථාවර තැන්පතු මත පොලි ආදායම	-	1,503,733
භාණ්ඩාගාර බිල්පත් මත පොලි ආදායම	369,695.05	-
ලැබිය යුතු - ධාරිතා වර්ධන	11,521,287.39	-
ණය හිමියෝ	32,029,936.79	-
වැට් බදු - 15% සිට 08%	94,846.48	-
	44,016,491.69	**82,933**

25 ප්‍රාග්ධන ප්‍රදාන හා සම්බන්ධ ක්ෂය කිරීම්

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රදානය කර ඇති ස්ථාවර වත්කම්වලට අදාළ ක්ෂය කිරීම්, එම වර්ෂයේ මුළු ක්ෂය අය කිරීම් අඩු කරමින් අදාළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට අයගත කරගනු ලැබ එය, වර්ෂය සඳහා වන මුළු ක්ෂය අය කිරීම එල්ලේ නිලවු කර ඇත.

26 බැඳියා සහ අවිනිශ්චිතතා

වාර්තා කරනු ලබන දිනයේදී කිසිදු සැලකිය යුතු බැඳියාවක් හෝ අවිනිශ්චිතතාවක් නොපැවතුණි.

27 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්

ප්‍රධාන පෙළේ කාර්යමණ්ඩල සාමාජිකයින් හා පවත්නා ගනුදෙනු

සමාගමෙහි ප්‍රධාන පෙළේ කාර්යමණ්ඩල සාමාජිකයින් වනුයේ, එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ ය. 2020 වර්ෂය තුළ, රැස්වීම්වලට සහභාගි වීමේ දීමනා සහ ප්‍රවාහන දීමනා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල සහ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් සඳහා පිළිවෙලින් රු. 402,000 සහ රු. 76,460 ක මුදලක් ගෙවා ඇත.

28 මූල්‍ය අවදානම් කළමනාකරණය

සමාගම්වල වැඩ කටයුතු පහත දැක්වෙන දෑ වැනි විවිධ මූල්‍ය අවදානම් වලට ඔවුන්ව නිරාවරණය කරවයි

(අ) වෙළෙඳ පොළ අවදානම (වෙළෙඳ පොළ අවදානම හා විදේශ විනිමය අවදානම ඇතුළුව)

(I) විදේශ විනිමය අවදානම

සමාගම විනිමය අනුපාතවල උච්චාවචනයන්ට සංවේදී වන අතර ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අගය උච්චාවචනයන්ට නිරාවරණය වේ. සමාගමේ ක්‍රියාකාරී මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වන අතර එමගින් බොහෝ ගනුදෙනු සිදු වේ. අනෙකුත් සියලුම ව්‍යවහාර මුදල් වාර්තා කිරීමේ කාර්යයන් සඳහා විදේශ මුදල් ලෙස සැලකේ.

(II) පොලි අනුපාත අවදානම

පොලි අනුපාත අවදානම යනු, වෙළෙඳ, පොළ පොලි අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය මෙවලමක සාධාරණ අගය හෝ අනාගත මුදල් ප්‍රවාහ උච්චාවචනය වීමේ ඇති අවදානමයි. සමාගම තම පොලි අනුපාත අවදානම කළමනාකරණය කරන්නේ, මුදල් ප්‍රවාහ නිරීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීමෙන් සහ ණය ගැනීම් සඳහා හිතකර අනුපාත සාකච්ඡා කිරීම මගිනි.

(ආ) ණය අවදානම

සමාගම ව්‍යාපාර කටයුතු කරන අතරතුර ගනුදෙනුකරුවන්ට ණය පහසුකම් ලබා දෙයි. එබැවින්, වෙළඳ ණය නොගෙවීම, වෙළෙඳාමෙන් ලැබිය යුතු මුදල් හා සම්බන්ධයෙන් වූ ප්‍රධාන අවදානමකි.

(ආ) ණය අවදානම් නිරාවරණය

සාමාන්‍යයෙන් ණය අවදානමට යටත් වන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් නිරාවරණය, ඒවායේ වාහක මුදලට සමාන වේ. පහත වගුව මගින් උපරිම අවදානම් ස්ථාන ගෙන හැර දක්වයි.

	12/31/2020	12/31/2019
වෙළෙඳ හා වෙනත් ගෙවීම් නියමිත	122,859,105.93	159,361,639
සම්බන්ධිත පාර්ශව වෙතින් ලැබිය යුතු මුදල්	15,525,527.07	27,625,102
මුදල් සහ මුදල් හා සමාන දෑ	448,334,872.86	487,882,035
මුළු ණය අවදානම් නිරාවරණය	**586,719,505.86**	**674,868,777**

(ඇ) ද්‍රවශීලතා අවදානම

මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමෙන් පියවා ගනු ලබන මූල්‍ය වගකීම් හා සම්බන්ධ බැඳීම් සපුරාලීමේ දී සමාගම විසින් මුහුණ දෙනු ලබන අවදානම මෙය වන්නේ ය.

සමාගමේ සමස්ත අවදානම් කළමනාකරණ වැඩසටහන, මූල්‍ය වෙළෙඳපළවල පුරෝකතනය කළ නොහැකි බව කෙරෙහි අවධානය යොමු කරන අතර එමගින් සමාගමේ මූල්‍ය ක්‍රියාකාරිත්වයට ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කර ගැනීමට උත්සාහ කරයි.

ජාතික විගණන කාර්යාලය

මගේ අංකය : VTY/C/SLTL/FA/2020 Date : 2021 දෙසැම්බර් 03

සභාපති,

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම.

2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ මූල්‍ය ප්‍රකාශ හා වෙනත් නියාමන අවශ්‍යතා සම්බන්ධයෙන් වූ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශ

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ (“සමාගම”) 2020 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය ,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව අනුව පිළියෙළ කරනු ලබන මගේ වාර්තාව, යථා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සභාගත කරනු ලබනවා ඇත.

මගේ වාර්තාවේ, තත්වාගණනය කළ මතය සඳහා පදනම යන කොටසෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශ තුළින් 2020 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඊට අදාළ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 68 ඡේදය ප්‍රකාරව, මාස 12 ක කාලයක් තුළ මුදල් කර ගැනීමට අපේක්ෂා නොකරන වත්කම්, මූල්‍ය ප්‍රකාශවල ජංගම නොවන වත්කම් යටතේ දැක්විය යුතුය. එසේ වුවද, වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර රු.138,304,576 ක් වූ මුදලක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 36 ඡේදය ප්‍රකාරව, එම වත්කම්වලට අයත් සියළුම වර්ගවල දේපළ, පිරියත හා උපකරණ සමාගම විසින් ප්‍රත්‍යාගණනය කරනු ලැබිය යුතුය. එසේ වුවද, සමාගමට අයත් රු. 6,757,881 ක ධාරණ වටිනාකමක් සහිත ගොඩනැගිලි දෙකක් ගිණුම් ගත නොකර පැහැර හැර තිබුණි. ඒ හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල සඳහන් විය යුතු ගොඩනැගිලි වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රු 331,722,680.ක් ලෙස ගණනය වූ වත්කම් ප්‍රත්‍යාගණන ලාභය, රු 383,845,970.ක් වූ සත්‍ය ප්‍රත්‍යාගණන ලාභයට බැර කරනු ලබනවා වෙනුවට ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණන සංචිතය රු 51,123,290.ක් වූ ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන්, "සුපෝෂ" නිෂ්පාදන විකුණුම් පිරිවැය රු. 21,946,829 ක් වූ මුදලක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල බදු බැරකම් රු 42,254,661ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දී සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කර තිබූ රු 16,286,540.ක ප්‍රදාන වත්කම් සාවද්‍ය ලෙස නැවත ක්‍රමක්ෂය කර තිබුණි .එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ දී ආදායම මෙම ප්‍රමාණයෙන් වැඩියෙන් ද, ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි.

(උ) කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම සඳහා දරා තිබූ රු 7,057,822.ක් වූ මූලධන වියදම් ප්‍රාග්ධනිත කරනු වෙනුවට පුනරාවර්තන වියදමක් ලෙස සලකා ආදායමෙන් කපා හැර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2020 වර්ෂයට අයත් වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති අනෙකුත් තොරතුරු

අදාළ අනෙකුත් තොරතුරු, සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරුවලින් සමන්විත වන නමුත් මූල්‍ය ප්‍රකාශ සහ ඒ පිළිබඳ මගේ විගණන වාර්තාව ඊට ඇතුළත් නොවන අතර, එම තොරතුරු මෙම විගණන වාර්තාවේ දිනයෙන් පසුව මා වෙත ලබා දීමට අපේක්ෂිතය. මෙම අනෙකුත් තොරතුරු සම්බන්ධයෙන් කළමනාකරණය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳව වන මගේ විගණනය සම්බන්ධයෙන් මගේ වගකීම වන්නේ, ඉහත හඳුනා ගෙන ඇති අනෙකුත් තොරතුරු, ඒවා ලබා ගත හැකි වූ විට කියවා බැලීම සහ, එසේ කිරීමේ දී, එම තොරතුරු, අදාළ මූල්‍ය ප්‍රකාශ හෝ විගණනයේ දී ලබාගත් මගේ දැනුම සැලකිය යුතු වැදගත් අයුරකින් අනුකූල වේද හෝ නොවේද යන්න හෝ වෙනත් සැලකිය යුතු වැදගත් ආකාරයකින් වැරදි ලෙස සඳහන් කර ඇත්ද යන්න සලකා බැලීමයි.

මවිසින් සමාගමට අයත් 2020 වාර්ෂික වාර්තාව කියවනු ලබන විට, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇති බව මා නිගමනය කරන්නේ නම්, ඒවා නිවැරදි කිරීම සඳහා අදාළ ආයතනයේ පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු අය වෙත එම කාරණය සන්නිවේදනය කිරීම මාහට නියමවී ඇත. තවදුරටත් ප්‍රමාණාත්මක නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශ

තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව යථා කාලයේ දී මව්සින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මාගේ වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, සමාගම අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ වැරදි හා වංචා නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑම විටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර ඒවා, මෙම මූල්‍ය ප්‍රකාශ, පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි හේතුයුක්ත අයුරින් යම් බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී .මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී . වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම්, මාගේ මතය විකරණය කළ යුතු ය. මගේ නිගමන පදනම් වනුයේ, මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා මවිසින් ලබා ගත් විගණන සාක්ෂි මත ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ සුවිශේෂී ගනුදෙනු හා සිද්ධීන් නියෝජනය වන අයුරින් උචිතව හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

අනෙකුත් කරුණු අතර, මගේ විගණනය අතරතුර මවිසින් හඳුනා ගනු ලබන අභ්‍යන්තර පාලනයන්හි පවත්නා යම් වැදගත් දුර්වලතා ඇතුළු සැලකිය යුතු විගණන නිගමනයන් සම්බන්ධයෙන් ද, ආයතනය පාලනය කරන්නා වූ පාර්ශවයන් සමග අදහස් හුවමාරු කර ගන්නා ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි පහත සඳහන් අවශ්‍යතා සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන ඇතුළත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියෙහි සඳහන් අවශ්‍යතාවන් අනුව, මගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා වන පදනම යන ඡේද කොටසෙහි විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයන් පෙනී යන ආකාරයට, සමාගම විසින් නිසි මූල්‍ය වාර්තා පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශ, 2007 අංක 7 දරන සමාගම් පනතෙහි 151 දරන වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මවිසින් කරන ලද සියලු නිර්දේශයන් ඉදිරිපත් කරන්නට යෙදුනු මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග හා ලබාගන්නා ලද සාක්ෂි මත සහ ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවී ය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීතිවලට හා විධිවිධානවලට යොමුව	විස්තරය
2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය	තාවකාලික අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමට පෙර ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාව ලබා ගත යුතු ය. එසේ නමුත්, එබඳු එකඟතාවක් ලබා නොගෙන සමාගම විසින් රු.මි. 302 ක මුදලක් ආයෝජනය කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සමාගමේ බලතල, කර්තව්‍යය හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස අදාළ කාල සීමාවන් තුළ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) නිෂ්පාදන ක්‍රියාවලියේ ඉවතලන අපතය මගින් ලැබෙන විකුණුම් ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ දී එලෙස ඉවතලන අපතය විකිණීම මගින් ලද රු. මි. 12.6 ක් වූ ආදායම එසේ බැර නොකර රඳවා ගනු ලැබ තිබුණි. එහෙයින්, 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වසර 10 ක කාල පරිච්ඡේදයක් සඳහා වන රු. මි. 152.5 ක් වූ ආදායම් ප්‍රමාණයක් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි.

(ආ) 2018, 2019 හා 2020 යන වර්ෂවල ත්‍රිපෝෂ නිෂ්පාදනය පිළිවෙළින් මෙ. ටොන් 11,913, මෙ. ටොන් 11,712 සහ මෙ. ටොන් 5,987 ක්ව පැවතිණි. ඒ අනුව, ඉකුත් වර්ෂයේ ත්‍රිපෝෂ නිෂ්පාදනය හා සංසන්දනය කරන කළ, පිළිවෙළින් 2019 හා 2020 යන වර්ෂ තුළ නිෂ්පාදනය සියයට 1.68 ක හා සියයට 48.48 ක ප්‍රතිශතයකින් පහත වැටී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ නොමිලයේ ලබා දෙන අතිරේක ත්‍රිපෝෂ ආහාරය සැපයුම සඳහා වන ඇස්තමේන්තුගත ත්‍රිපෝෂ නිෂ්පාදනය මෙ. ටොන් 18,854 ක් වුව ද, මෙ. ටොන් 5,987 ක් හෙවත් සියයට 32 ක් වූ ප්‍රමාණයක් පමණක් නිපදවා තිබිණි. තවද, 2020 වසර තුළ බඩ ඉරිහු හා සෝයා බෝංචි වැනි සීමිත අමු ද්‍රව්‍ය යොදා ගනිමින් වාණිජ අරමුණු මත "සුපෝෂ" මෙ.ටොන් 2,051 ක් නිපදවා තිබූ අතර එමගින්, සමාගමේ මුඛ්‍ය පරමාර්ථය ඉටු කර ගත හැකි නොවී තිබුණි.

අත්. කළේ/ ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති